# 2012

# වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව
# வருடாந்த நிறைவேற்று மற்றும் கணக்கு அறிக்கை
# Performance and Financial Report








District Secretariat
Dam Street,
Colombo 12

# කොළඹ දිසාපති / දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය



2012 වර්ෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නැගී සිටීම් වලට හා කඩා වැටීම් වලට මුහුණ දුන් වර්ෂයක් වශයෙන් හඳුන්වා දීමට පුළුවන. විශේෂයෙන්ම එම වසර තුළ සමස්ථ දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි ඒකාබද්ධ සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට මුලපිරුව අතර මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා පළාත් සභා මට්ටමින් සේවය කරන නිලධාරීන් ඒකරාශී කර නව අංශ දෙකක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

1. සමාජ සුභසාධන ආගමික හා සංස්කෘතික අංශය
2. සංවර්ධන අංශය

විශේෂයෙන්ම සමාජ සුභසාධන අංශයට ළමා සංවර්ධන, පූර්ව ළමාවිය, කාන්තා සංවර්ධන, සමාජසේවා, වැඩිහිටි, ආබාධිත, ආගමික, සංස්කෘතික අංශ නියෝජනය කරමින් සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන් ඇතළත් කළ අතර සංවර්ධන අංශ, කෘෂි කර්ම, ඵලදායිතා, තරුණ කටයුතු, සමෘද්ධි, වෘත්තීය පුහුණු, විදාතා යනාදී අංශ නියෝජනය කරන ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළත් කෙරිණ. මෙමගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13හි ක්ෂේත්‍ර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් , සමෘද්ධි නිලධාරීන් දැනුවත් කිරීම සිදුකළ අතර ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයකට මෙම අංශ දායක කර ගැනීමට ද පියවර ගන්නා ලදී.

මෙයට අමතර දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධන ප්‍රගතිය විමසා බැලීමේ අතිගරු ජනාධිපති තුමාගේ වැඩසටහන යටතේ 2012 ජූලි මස 13 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරු , අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු දිස්ත්‍රික්කයේ ඉහල නිලධාරීන් සහභාගී වූ සාර්ථක රැස්වීමක් පැවැත්වීමට හැකි විය. එහිදී මධ්‍ය කාලීන සංවර්ධන රාමුවකට අනුගතව සංවර්ධන හා සුභසාධන ඉලක්ක ඉදිරිපත් කල අතර එය 2012-2016 දක්වා වන ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් ලෙස ඉදිරිපත් කිරීමට හැකිවිය. එහිදී කෘෂිකර්මාන්ත, ජලසම්පාදන, විදුලිය වැනි යටිතලපහසුකම් අංශ මෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ දැනට ප්‍රශ්ණ වන සුළු වැස්සකදී පවා ඇතිවන ගංවතුර ගැටලුව, කුණු කඳු ප්‍රශ්ණය, රථවාහන තදබදය, ළමා අපචාර හා අපරාද පිළිබඳව අවධානය යොමුකර ඉලක්කගත වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීමට හැකි විය. මෙයට අමතරව අධ්‍යාපන, සෞඛ්‍ය, සමෘද්ධි, විමධ්‍යගත හා පළාත් මාර්ග, ගමනැගුම, එක ගමකට එක වැඩසටහනක් වැනි ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ගැන ද අවධානය යොමු කරන ලදී.

එසේම දිස්ත්‍රික් පරිපාලනයේ ප්‍රධාන මධ්‍යස්ථානය වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳවත් එය උපයෝගී කරගනිමින් කාර්යාල පරිපාලන කටයුතු කාර්යක්ෂමවත්,ඵලදායීවත් ගෙනයාම සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීමේ වැඩසටහන් ආරම්භ කර ස්ථාපිත කිරීමට ද මේ වර්ෂය තුළ අවස්ථාව ලැබුණි.

ඒ අනුව 2012 වසර තුළ කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව සෘජු මෙන්ම ආයතන අධීක්ෂණයේ පවත්වා ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංවර්ධන කටයුතු මිලියන 6000ක ඉලක්කයක් සපුරා ගැනීමට හැකිවූ බව සන්තෝෂයෙන් යුතුව සිහිපත් කරමි. ඒ සඳහා සහාය දුන් සියලුම දේශපාලන නායකත්වයන්ටත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ග්‍රාම නිලධාරී කාර්යාලය දක්වා සේවය කරන සියලුම නිලධාරීන්ටත් ප්‍රණාමය පුද කරමි.

මෙම සියළුම ජයග්‍රහණ හමුවේ අප මුහුණපෑ ප්‍රබල අභියෝගය වූයේ 2012 නොවැම්බර් මස 26 වන දා රාත්‍රී කාලයේ ඇතිවූ ගින්න පැය 06ක පමණ කාලයක් පැවතීම හේතු කර ගෙන මහල් දෙකකින් සමන්විත වූ මුළු ගොඩනැගිල්ලම හා ලිපිගොනු හා වටිනා භාණ්ඩ විනාශයට පත්විය. එවැනි වාතාවරණයක් තුළ වුවද 2012 නොවැම්බර් 27 දින පැවති රජයේ නිවාඩු දිනයේ පවත්නා සීමිත සම්පත් උපයෝගී කරගෙන 2012 නොවැම්බර් 28 දින සිට ඒ පරිශ්‍රය තුළම පැවති අනෙකුත් ගොඩනැගිලි භාවිතා කර නැවත කාර්යාල කටයුතු ස්ථාපිත කළ අතර සමහර ශාඛාවන් ගින්නට හසු නොවූ ශ්‍රවණාගාරයේ ද පුහුණු හා සමෘද්ධි අංශ වලද ස්ථාපිත කරමින් ජනතා සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය නායකත්වය ලබා දෙන ලදී. එමෙන්ම ගින්න සමග ඇති වූ සේවක මානසික අවපාතය තේරුම්ගනිමින් විවිධ පුහුණු වැඩසටහන් හරහා කණ්ඩායම් හැඟීම හා නැවත නැගීසිටීම සඳහා ජවසම්පන්න වූ නායකත්වයක හා මානසික ශක්තියක අවශ්‍යතාවයද පෙන්වාදෙන ලදී.

ඒ අනුව 2012 දෙසැම්බර් 31 දින ට භාණ්ඩාගාරයේ නීති රීති පිළිපදිමින් ගිණුම්වාර්තා සකස් කළ අතර විනාශයට ලක් වූ ලිපිගොනු නැවත ස්ථාපිත කිරීම සඳහා විකල්ප ක්‍රියා මාර්ග ගැනීම, විනාශ වූ දේපල සඳහා අලාභය තක්සේරු කිරීම ආදී කටයුතු අදාළ වසර අවසන් වන විට ආරම්භ කිරීමට හැකි විය.

2012 නොවැම්බර් 26 දිනයෙන් පසුව එළඹි වකවානුව බලවත් දුෂ්කරතා මධ්‍යයේ කටයුතු කල වකවානුවක් වූ අතර ඒ වන විට සැලසුම් කරන ලද කිසිඳු සංවර්ධන කටයුත්තක් අඩාල නොවී අවසන් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩල , ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු සියලුම කාර්ය මණ්ඩල ප්‍රාදේශීය සභා, නගරසභා, මහනගර සභාවල දේශපාලන නායකත්වය ඇතුළු කාර්ය මණ්ඩල පළාත්සභා අමාත්‍යාංශ වල දේශපාලන නායකත්වය ඇතුළු සියලුම කාර්ය මණ්ඩල වලින් ලැබුණු සහාය උදක්ම අගය කරමි.

එච්.ටී. කමල් පත්මසිරි
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය.

# අපගේ දැක්ම

දිස්ත්‍රික් පරිපාලනය
ශක්තිමත් කිරීම තුලින්
කාර්යක්ෂමව හා ඵලදායීව
ජනතාවට සේවා සැපයීම.

# අපගේ මෙහෙවර

ප්‍රාදේශීය පරිපාලනය
ශක්තිමත් කරමින් රාජ්‍ය
ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට අදාල
සියලු පාර්ශවයන්ගේ සහයෝගය ඇතුව
ප්‍රශස්ත ලෙස සම්පත් ප්‍රයෝජනයට ගෙන
සංවර්ධන ක්‍රියාවලීන් මනාව මෙහෙයවීම
තුලින් ජනතා ශුභ සිද්ධිය සැලසීම.

# පටුන


| | පිටුව |
|---|---|
| 1. ආයතන අංශය | 09 |
| 2. ගිණුම් අංශය | 13 |
| 3. සැලසුම් අංශය | 14 |
| 4. සමෘද්ධි අංශය | 31 |
| 5. ඉංජිනේරු අංශය | 39 |
| 6. පුපුරණ ද්‍රව්‍ය අංශය | 40 |
| 7. මිණුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය | 41 |
| 8. දිස්ත්‍රික් ක්‍රීඩා අංශය | 42 |
| 9. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය | 43 |
| 10. සංඛ්‍යාලේඛණ අංශය | 44 |
| 11. සංස්කෘතික අංශය | 51 |
| 12. සමාජසේවා අංශය | 54 |
| 13. ජාතික තරුණ සේවා සභාව | 56 |
| 14. ආපදා කළමනාකරණ ඒකකය | 58 |
| 15. බෞද්ධ කටයුතු අංශය | 62 |
| 16. ප්‍රාදේශීය සංවර්ධනය | 65 |
| 17. විශේෂ වැඩසටහන් | 69 |
| 18. කෘෂිකර්ම අංශය | 70 |
| 19. 2012.11.26 දින සිදු වූ ව්‍යසනය | 71 |
| 20. ගිණුම් විස්තරය | 74 |

# කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ
# 2012 වාර්ෂික කාර්යසාධන වාර්ථාව.

බස්නාහිර පළාතේ ප්‍රධානම දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කය වර්ග කි.මී.675 කින් යුක්තය. මෙහි මායිම් වශයෙන් උතුරින් කැළණි ගඟද , දකුණෙන් පානදුර බොල්ගොඩ ගඟද , බස්නාහිරින් මුහුදු තීරයද, නැගෙනහිරින් සබරගමු පලාත් මායිම්ද සීමා මායිම් කොටගෙන පිහිටා ඇත.

ලංකාවේ දිස්ත්‍රික්කයක සිටින වැඩිම ජනගහනය වන 2251274 ක් ජීවත්වන කොළඹ දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 කින් යුක්ත වන අතර ඒවායේ කටයුතු කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කර මෙහෙයවනු ලබයි.

ඒ ඒ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කටයුතු නිරතුරුව අධීක්ෂණය කරමින් මෙහෙයවමින් හා ඔවුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කරමින් 225,1274 ක් තරම්වූ ජනගහනයකගේ කටයුතු වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකරදීම කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදුකරනු ලබයි.

සියලු කටයුතු කළමනාකරණය කරමින් අපේක්ෂිත මෙහෙවර ප්‍රශස්ත මට්ටමින් ඉටුකරලීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයකම සියලුම මට්ටමේ නිලධාරීන් දායකත්වය ලබාදෙන ලදී.




කොළඹ දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ 15 කින් සහ පළාත් පාලන ආයතන 13 කින් සමන්විතය.

## මැතිවරණ කොට්ඨාශ

| කොට්ඨාශය | ජනගහනය |
|---|---|
| උතුරු කොළඹ | 140905 |
| මැද කොළඹ | 244661 |
| බොරැල්ල | 100578 |
| නැගෙනහිර කොළඹ | 102174 |
| බටහිර කොළඹ | 76031 |
| දෙහිවල | 104412 |
| රත්මලාන | 111473 |
| කොලොන්නාව | 165336 |
| කෝට්ටේ | 119316 |
| කඩුවෙල | 214557 |
| සීතාවක | 140640 |
| හෝමාගම | 202228 |
| මහරගම | 189888 |
| කැස්බෑව | 214934 |
| මොරටුව | 182065 |
| **එකතුව** | **2309199** |

# පලාත් පාලන ආයතන

| මහනගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා |
|---|---|---|
| 1.කොළඹ | කොලොන්නාව | කොටිකාවත්ත මුල්ලේරියාව |
| 2. දෙහිවල ගල්කිස්ස | සීතාවකපුර | සීතාවක |
| 3. මොරටුව | මහරගම | හෝමාගම |
| 4. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | කැස්බෑව | |
| 5. කඩුවෙල | බොරලැස්ගමුව | |

දිස්ත්‍රික්කයේ ජනතාවගේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකරනුවස් කොළඹ දිස්ත්‍රික්කය පහත සඳහන් පරිදි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 557 කට බෙදා ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වසම් ගණන |
|---|---|
| තිඹිරිගස්යාය | 20 |
| දෙහිවල | 15 |
| රත්මලාන | 13 |
| මොරටුව | 42 |
| කඩුවෙල | 57 |
| කොලොන්නාව | 46 |
| සීතාවක | 68 |
| හෝමාගම | 81 |
| කැස්බෑව | 73 |
| මහරගම | 41 |
| ශ්‍රී ජ.පුර කෝට්ටේ | 20 |
| පාදුක්ක | 46 |
| කොළඹ | 35 |

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ



# 01. ආයතන

දිස්ත්‍රික් ලේකම්ගේ පාලනයට ගැනෙන සියලුම නිලධාරීන්ගේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම ආයතන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

- නව පත්කිරීම්
- සේවා කාලය දීර්ඝ කිරීම්
- විශ්‍රාම ගැන්වීම්
- කොස්ගස් බලපත්‍ර නිකුත්කිරීම
- පූරිසහික නාමලේඛණ සැකසීම
- පුහුණු කටයුතු
- නිවාඩු දුම්රියබලපත්‍ර කටයුතු
- නිලධාරීන්ගේ ණය කටයුතු
  - දේපල ණය
  - වාහන ණය
  - ආපදා ණය
  - පාපැදි ණය

ඉහත ආයතනික පරිපාලන සේවාවන්ට  අමතරව පහත සඳහන් කාර්යයන් ද ඉටු කරනු ලබයි.

- ප්‍රාදේශීය මහලේකම් කාර්යාලවල පරිපාලන කටයුතු හා අධීක්ෂණ කටයුතු
- බෞද්ධ කටයුතු හා සංස්කෘතික කටයුතු, බෙල්ලන්විල හා කෝට්ටේ පෙරහැර ඇතුළු වෙසක් උත්සව සංවිධාන කටයුතු
- සමාජසේවා කටයුතු
- ආපදා කළමනාකරණ කටයුතු  (ගංවතුර, සුනාමි ව්‍යසන ආදී)
- දැව බලපත්‍ර සම්බන්ධ කටයුතු
- පරිසර සංවර්ධන කටයුතු
- නිවාස කටයුතු
- කෘෂිකර්ම කටයුතු
- මැතිවරණ කටයුතු
- දිස්ත්‍රික් පුහුණු කටයුතු
- රාජ්‍ය උත්සව සඳහා දායකත්වය ලබාදීම
- ග්‍රාම නිලධාරී පොදු කටයුතු හා විනය කටයුතු
- උප්පැන්න සහතික පරිලෝකණගත කිරීම
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ට්‍රාර්වරුන් සහ හදිසි මරණ පරීක්ෂකවරුන් පත්කිරීම හා එයට අදාළ සියලු කටයුතු
- අභ්‍යාසලාභී උපාධිධාරී සම්මුඛ පරීක්ෂණ, පත්වීම් හා ස්ථාන මාරු කටයුතු

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය

භෞතික සම්පත් :-

- පරිගණක ජාල ගත කිරීම
  කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය රු.15,00,000.00කට ආසන්න මුදලක් වැය කරමින් නිම කළ අතර, ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථාපිත ආයතන, සැලසුම්, ගිණුම් හා ඉංජිනේරු අංශවල සිදුකරන ලද පරිගණක ජාල ගත කිරීම් පමණක් 2012.11.26 දින හට ගත් ගින්න හේතුවෙන් සම්පූර්ණයෙන් විනාශ විය.

මානව සම්පත් :-

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් **"අළුමතින් නැගී සිටීම"** යන තේමාව යටතේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ එක් දින වැඩමුළුවක් 2012 දෙසැම්බර් මස දී පැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි වේ.

| තනතුර | සේවාව | සංඛ්‍යාව |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ) | 01 |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ලං.ප.සේ 1 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ගණකාධිකාරී සේවය 1 | 02 |
| දිස්ත්‍රික් ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉංජිනේරු සේවය | 01 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ලං.ප.සේ 111 | 01 |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ගණකාධිකාරී සේවය 111 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (අධි) | කළමනාකරණ සහකාර සේවය | 01 |
| 1 | | 04 |
| 11 | | 05 |
| 111 | | 11 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර 111 | ශ්‍රී.ලං.තොරතුරු තාක්ෂණ සේවය | 02 |
| සැලසුම් ශිල්පී 11 ආ | ශ්‍රී.ලං.තාක්ෂණ සේවය | 01 |
| සංවර්ධන සම්බන්ධීකාරක | | 02 |
| පිළිගැනීමේ නිලධාරී | | 01 |
| කා.සේ.සේ. 11 | කාර්යාල කාර්ය සේවක සේවය | 01 |
| 111 | කාර්යාල කාර්ය සේවක සේවය | 07 |
| රියදුරු 11අ | රියදුරු සේවය | 02 |
| 111 | රියදුරු සේවය | 03 |


දිස්ත්‍රික් ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
අතිරේක දිස්ත්‍රික් ලේකම්
අධ්‍යක්ෂ (සැලසුම්)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
දිස්ත්‍රික් ඉංජිනේරු
සහකාර දිස්ත්‍රික් ලේකම්
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර සමෘද්ධි කොමසාරිස්
පරිපාලන නිලධාරී
දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරු
දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරීන්
තරුණසේවා -අංශය
පුපුරණ ද්‍රව්‍ය - අංශය
ක්‍රීඩා - අංශය
සංස්කෘතික නිලධාරී
සමාජසේවා නිලධාරී
කාන්තා නිලධාරී
ළමා හිමිකම් - අංශය
ආපදා - අංශය
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
තොරතුරු සං. හා තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
සමෘද්ධි සංවර්ධන සහකාර
රියදුරු/කා.කා.ස
රියදුරු/කා.කා.ස
රියදුරු/කා.කා.ස
රියදුරු/කා.කා.ස
රියදුරු/කා.කා
රියදුරු/කා.කා.ස
රියදුරු/කා.කා

උපත්, මරණ, විවාහ සහතික පරිලෝකනය කිරීමේ 2012 වසරේ දිස්ත්‍රික් ප්‍රගතිය පහත පරිදි වේ.

## BMD ප්‍රගතිය 2012/12/31 දිනට

| | කොළඹ | දෙහිවල | රත්මලාන | මොරටුව | කැස්බෑව 2009 - 2012 | සීතාවක 2008 -2012 | කඩුවෙල | කොලොන්නාව | මහරගම | ශ්‍රීජයවර්ධනපුර කෝට්ටෙ | හෝමාගම 2007 -2012 | තිඹිරිගස්යාය | පාදුක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2012/12/31 දිනට පරිලෝකනය කල ප්‍රමාණය** | | | | | | | | | | | | | |
| උප්පැන්න | 354765 | | 28444 | 79257 | 346 | 210200 | 14400 | 26084 | | 17100 | 140500 | | 32975 |
| විවාහ | 379014 | 464460 | 29969 | 60854 | 2322 | 56700 | 28663 | 43714 | 238370 | 39100 | 51500 | 2507136 | 21248 |
| මරණ | 90484 | | 21492 | 28179 | 438 | 69900 | 16469 | 36062 | | 12800 | 125300 | | 13128 |
| | | | | | | | | | | | | | |
| පරිලෝකනයකලයුතු ප්‍රමාණය | | | | | | | | | | | | | |
| උප්පැන්න | | | | 15000 | 100 | 6800 | | ඉතිරිව | 6600 | 200 | 4100 | 67100 | - |
| විවාහ | 15000 | 17600 | 2000 | 2500 | 6000 | 1400 | 1300 | නැත | 1700 | 1600 | 3500 | 4100 | 1000 |
| මරණ | | | | 1000 | 1200 | 2100 | 700 | | 4700 | 200 | 3500 | 16300 | 500 |
| | | | | | | | | | | | | | |
| නිකුත්කල සහතික ප්‍රමාණය | 31380 | 92747 | 8798 | 7491 | 10330 | 29611 | 47272 | 11305 | 64091 | 39616 | 22047 | 129131 | 33709 |
| | | | | | | | | | | | | | |

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නිකුත් කරන ලද සහතික ප්‍රමාණ ප්‍රතිශත වශයෙන් පහතින් දැක්වේ.




## 02. ගිණුම් අංශය

දිස්ත්‍රික් ලේකම් වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේත් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත් මූල්‍ය කටයුතු කළමනාකරණය සහ අධීක්ෂණය කිරීමේ වගකීම ගිණුම් අංශය විසින් ඉටුකරනු ලබයි. එම මූල්‍ය කළමනාකරණ කාර්යය පහත සඳහන් ඒකක මගින් ඉටුකර ඇත.

- ආදායම් සහ වියදම් සම්බන්ධයෙන්ද අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන්ද වාර්ෂික ඇස්තමේන්තු සකස්කිරීම සහ මුදල් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ගිණුම් තබා ඇත්තේ ශීර්ෂ අංක 255.01 යටතේ වන අතර අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් ගිණුම් තබා ඇත්තේ විෂය අංක 225011 යටතේය.
- අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම.

ඉහත කටයුතු ගිණුම් අංශයේ අංශ තුනක් මගින් ඉටුකරනු ලැබේ.

1. පාලන ගිණුම් ඒකකය.
2. දෙපාර්තමේන්තු ගිණුම් ඒකකය.
3. අභ්‍යන්තර විගණන ඒකකය.

(මූල්‍ය වාර්ථාවේ සියලුම විස්තර අමුණා ඇත.)

# 03. සැලසුම්

## අරමුණු

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි ග්‍රාම නිලධාරී වසම් 557 හි ගෘහ ආර්ථික ඒකක චිරස්ථායි ලෙස සවිබල ගැන්වීම.
- දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාමුදුන්පමුණුවා ගැනීම සහ සංවර්ධන විෂමතා අවම වන ආකාරයට ගම නැගුම, දිස්ත්‍රික් අයවැය සහ අනෙකුත් රජයේ මූල්‍ය සම්පත් ප්‍රශස්ථ ලෙස ආයෝජනය කිරීම.
- සංවර්ධන වැඩ සටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ක් වන ප්‍රශස්ථ මට්ටමෙහි පවත්වාගෙන යාම.
- දිස්ත්‍රික්කයේ ජනතාවගේ සමාජ, ආර්ථික ගැටළු කඩිනමින් විසඳීම සඳහා ගරු දේශපාලන නායකත්වය,රාජ්‍ය ආයතන, පුද්ගලික අංශය යන පාර්ශව සමඟ විධිමත් හා කාර්යක්ෂම සම්බන්ධීකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.
- දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ ප්‍රගති පාලනය
- දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා පහසුකාරක ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

## කාර්යභාරය

- දිස්ත්‍රික්කය තුල සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
- දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම,අධීක්ෂණය සහ ප්‍රගතිය විමර්ශනය කිරීම.
- ගමනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම,අධීක්ෂණය සහ ප්‍රගති පාලනය.
- දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම,අධීක්ෂණය සහ ප්‍රගති පාලනය.
- දිස්ත්‍රික් අයවැය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම,අධීක්ෂණය සහ ප්‍රගති පාලනය.
- පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම,අධීක්ෂණය සහ ප්‍රගති පාලනය.
- දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමේ වැඩ සටහනට අදාල දිස්ත්‍රික් කාර්යභාරය.
- දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම හා පස් අවුරුදු සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සම්පත් පැතිකඩ සකස් කිරීමට මඟ පෙන්වීම.
- දිස්ත්‍රික් තොරතුරු හා දත්ත පද්ධතිය, සම්පත් පැතිකඩ සකස් කිරීම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ හා සංවර්ධන කමිටුවට අදාල සියලු කටයුතු මෙහෙයවීම හා පවත්වාගෙන යාම.
- සංවර්ධන කාර්යභාරයට අදාලව අවශ්‍ය තොරතුරු හා මඟ පෙන්වීම් ලබාදීමේ පහසුකාරක වශයෙන් ක්‍රියා කිරීම.

## ගම නැගුම - සවිබල ගැන්වුන ප්‍රජාවක් "එක් ගමකට එක් වැඩක්" වැඩසටහන 2012

සංවර්ධනයේ ඵල සැමට සමානව උරුමකර දීමේ පදනම නමින්ම ගම්‍යවන මෙම වැඩසටහනෙහි සුවිශේෂත්වය වූයේ ගම නැගුම වැඩසටහනේ ව්‍යාපෘති තෝරාගැනීමේ පදනම වඩාත් පුළුල් කර, වර්ෂයේ වැඩසටහන සඳහා වෙන්වූ සීමිත සම්පත් සාපේක්ෂ වශයෙන් රට පුරා බෙදාහරින ක්‍රමවේදයක් පදනම්කොට ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමයි. එනම් දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් වෙනුවෙන් එක් ව්‍යාපෘතියක් හා එම ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියනයක් ප්‍රතිපාදනයක් වෙන් කිරීමයි.

ඒ යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි ග්‍රාම නිලධාරි වසම් 577 තුළ ව්‍යාපෘති 577 ක් හඳුනාගත් අතර ඒ වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 557,000,000.00 කි. 2012/12/31 දිනය වන විට එම ව්‍යාපෘති අතරින් 488 ක වැඩ සම්පූර්ණයෙන්ම නිමවී තිබූ අතර රු. 407,302,662.82 ක් ඒ වෙනුවෙන් වැය කර පවුල් 528205 කට සෘජු ප්‍රතිලාභ අත්කර දී තිබිණි.

තවද මුල සිටම ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ක්‍රමෝපායක් උපයෝගීකරගත් ගම නැගුම වැඩසටහන තුළ රු. 34,950,094.33 ක ඇස්තමේන්තුගත වැඩ වටිනාකමක් ප්‍රජා දායකත්වයෙන් ඉටුවීම කොළඹ දිස්ත්‍රික්කය වැනි නාගරික හා අර්ධ නාගරික ජනතාවක් වාසය කරන දිස්ත්‍රික්කයක් තුළ ඇගයිය යුතු තත්වයකි.



# 1. ගම නැගුම - එක් ගමකට එක් වැඩක් වැඩසටහන

## මුල්‍ය හා භෞතික ප්‍රගතිය - කොට්ඨාශ අනුව

| ප්‍රා.ලේ. කොට්ඨාශය | අනුමත මුදල රු. | 2021-12-31 දිනට ගෙවූ මුදල රු. | තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන රු. | අතැති බිල්පත් වටිනාකම රු. | අවිච්ඡේද වටිනාකම රු. | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | | | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 100 % | අතැති බිල්පත් | අවිච් ඡේද | ක්‍රියාත් මක නොවූ | |
| කඩුවෙල | 57,000,000.00 | 32,627,617.19 | 21,567,133.57 | 8,912,299.42 | 12,654,834.15 | **57** | **43** | **13** | **13** | **1** | 13470 |
| කැස්බෑව | 73,000,000.00 | 63,878,712.98 | - | - | - | **73** | **73** | **0** | **0** | **0** | 81815 |
| කොළඹ | 35,000,000.00 | 16,949,571.31 | 7,867,702.64 | - | 7,867,702.64 | **35** | **18** | **0** | **12** | **5** | 81200 |
| කොලොන්නාව | 46,000,000.00 | 43,154,527.13 | 10,500.00 | 10,500.00 | - | **46** | **46** | **1** | **0** | **0** | 159156 |
| කෝට්ටේ | 20,000,000.00 | 9,227,088.60 | 2,703,009.05 | 944,087.60 | 1,799,536.70 | **20** | **11** | **1** | **3** | **6** | 9125 |
| තිඹිරිගස්යාය | 20,000,000.00 | 8,479,254.69 | 4,951,244.46 | - | 3,579,188.07 | **20** | **9** | **0** | **5** | **6** | 12740 |
| දෙහිවල | 15,000,000.00 | 11,662,000.34 | 2,894,907.96 | 2,894,907.96 | - | **15** | **15** | **7** | **0** | **0** | 4400 |
| පාදුක්ක | 46,000,000.00 | 44,572,603.06 | - | - | - | **46** | **46** | **0** | **0** | **0** | 28490 |
| මහරගම | 41,000,000.00 | 35,555,344.40 | 2,417,910.70 | 1,417,910.70 | 1,000,000.00 | **41** | **40** | **2** | **1** | **0** | 11830 |
| මොරටුව | 42,000,000.00 | 40,129,731.85 | - | - | - | **42** | **42** | **0** | **0** | **0** | 27814 |
| රත්මලාන | 13,000,000.00 | 12,027,766.87 | - | - | - | **13** | **13** | **0** | **0** | **0** | 12870 |
| සීතාවක | 68,000,000.00 | 39,123,708.12 | 23,106,247.99 | 12,678,758.29 | 10,427,489.70 | **68** | **55** | **38** | **13** | **0** | 31003 |
| හෝමාගම | 81,000,000.00 | 49,914,736.28 | 29,213,960.53 | 25,283,106.97 | 3,930,853.56 | **81** | **77** | **33** | **4** | **0** | 54292 |
| මුළු එකතුව | 557,000,000.00 | 407,302,662.82 | 94,732,616.90 | 52,141,570.94 | 41,259,604.82 | **557** | **488** | **95** | **51** | **18** | 528205 |

## මුල්‍ය හා භෞතික ප්‍රගතිය - සංරචක අනුව

| සංවරකය | අනුමත මුදල රු. | **2021-12-31** දිනට ගෙවූ මුදල රු. | තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන රු. | අතැති බිල්පත් වටිනාකම රු. | අවිච්ඡේද වටිනාකම රු. | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 100% | අතැති බිල්පත් | අවිච්ඡේද | |
| ක්‍රීඩා සංවර්ධනය | 9,000,000.00 | 7,572,253.93 | 977,205.01 | 491,529.76 | 485,675.25 | **9** | **8** | **1** | **1** | 14295 |
| ජල සම්පාදනය | 6,000,000.00 | 4,226,344.98 | 882,374.37 | - | 882,374.37 | **6** | **4** | **0** | **1** | 2975 |
| නිවාස සංවර්ධනය | 1,000,000.00 | - | - | - | - | **1** | **0** | **0** | **0** | 0 |
| පෙර පාසල් සංවර්ධනය | 16,000,000.00 | 12,400,688.72 | 2,738,833.90 | 1,486,763.26 | 1,252,070.64 | **16** | **14** | **4** | **2** | 18621 |
| ප්‍රජාශාලා සංවර්ධනය | 17,000,000.00 | 12,971,233.04 | 3,307,814.13 | 1,990,728.63 | 1,317,085.50 | **17** | **15** | **5** | **2** | 27467 |
| මාතෘ සායන | 6,000,000.00 | 5,658,956.89 | - | - | - | **6** | **6** | **0** | **0** | 15367 |
| මාර්ග සංවර්ධනය | 451,000,000.00 | 330,605,562.64 | 77,030,553.95 | 47,757,275.77 | 28,856,541.30 | **451** | **406** | **83** | **33** | 363931 |
| වෙනත් ගොඩනැඟිලි | 23,000,000.00 | 15,810,419.26 | 3,942,578.19 | 415,273.52 | 3,069,952.54 | **23** | **16** | **2** | **4** | 35131 |
| වෙරළ උද්‍යාන සංවර්ධනය | 1,000,000.00 | 959,920.00 | - | - | - | **1** | **1** | **0** | **0** | 200 |
| සනීපාරක්ෂාව | 10,000,000.00 | 3,135,403.47 | 4,400,905.22 | - | 4,400,905.22 | **10** | **3** | **0** | **7** | 19409 |
| සුසාන භූමි | 1,000,000.00 | 980,000.00 | - | - | - | **1** | **1** | **0** | **0** | 2111 |
| සුළු වාරිමාර්ග | 12,000,000.00 | 9,193,502.09 | 995,000.00 | - | 995,000.00 | **12** | **10** | **0** | **1** | 13118 |
| ළමා උද්‍යාන | 4,000,000.00 | 3,788,377.80 | 457,352.13 | - | - | **4** | **4** | **0** | **0** | 15580 |
| මුළු එකතුව | **557,000,000.00** | **407,302,662.82** | **94,732,616.90** | **52,141,570.94** | **41,259,604.82** | **557** | **488** | **95** | **51** | **528205** |

## ගම නැගුම විශේෂ ව්‍යාපෘති

| ප්‍රා.ලේ. කොට්ඨාශය | අනුමත මුදල රු. | 2021-12-31 දිනට ගෙවූ මුදල රු. | තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන රු. | අතැති බිල්පත් වටිනාකම රු. | අවිච්ඡේද වටිනාකම රු. | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 100% | අතැති බිල්පත් | අවිච්ඡේද | ක්‍රියාත්මක නොවූ |
| කඩුවෙල | 9,600,000.00 | 4,504,092.11 | 4,786,230.38 | 4,786,230.38 | 0 | 9 | 9 | 5 | - | - |
| කොළඹ | 1,000,000.00 | - | - | - | - | 1 | - | - | - | 1 |
| තිඹිරිගස්යාය | 2,000,000.00 | 247,660.53 | - | - | - | 2 | 1 | - | - | 1 |
| මහරගම | 1,176,000.00 | 117,212.64 | 1,058,787.36 | 0 | 1,058,787.36 | 1 | - | - | 1 | - |
| සීතාවක | 6,000,000.00 | - | - | - | - | 6 | - | - | - | 6 |
| හෝමාගම | 2,000,000.00 | - | 1,999,600.00 | 1,846,074.79 | 153,525.21 | 2 | 1 | 2 | 1 | - |
| **මුළු එකතුව** | **21,776,000.00** | **4,868,965.28** | **7,844,617.74** | **6,632,305.17** | **1,212,312.57** | **21** | **11** | **7** | **2** | **8** |

## 2. විමධ්‍යගත අයවැය වැඩ සටහන

ග්‍රාමිය ආර්ථික ක්‍රියාකාරකම් වල වර්ධනය උදෙසා විමධ්‍යගත අයවැය වැඩසටහන 2012 යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් මඟින් මහඟු පිටුවහලක් සිදු වී ඇත. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රතිපාදන ලබා දීම සිදු කරන ලදී.

2012 වර්ෂයේ මෙම වැඩසටහන වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් සඳහා රු.මි.95ක්ද, ජාතික ලැයිස්තුවෙන් පත් වූ මන්ත්‍රීවරුන් සඳහා රු.මි. 29.67කද මුලා ප්‍රතිපාදන වෙන් කෙරුණි.



# මුල්‍ය හා භෞතික ප්‍රගතිය - කොට්ඨාශ අනුව

| ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | විමධ්‍යගත අයවැය වැඩසටහන | භෞතික ප්‍රගතිය | | වියදම රු. |
|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් නොවූ | වැඩ අවසන් | |
| තිඹිරිගස්යාය | 133 | 17,360,236.88 | 0 | 133 | 17,141,511.08 |
| පාදුක්ක | 47 | 4,836,437.00 | 0 | 47 | 4,678,110.18 |
| කොලොන්නාව | 57 | 5,085,000.00 | 0 | 57 | 4,851,227.73 |
| හෝමාගම | 102 | 11,304,406.82 | 0 | 102 | 9,846,605.45 |
| සීතාවක | 99 | 9,160,000.00 | 0 | 99 | 8,350,397.70 |
| මොරටුව | 50 | 5,896,738.72 | 0 | 50 | 5,896,738.72 |
| කෝට්ටේ | 55 | 6,374,844.70 | 1 | 54 | 6,005,676.68 |
| දෙහිවල | 32 | 3,180,052.81 | 0 | 32 | 3,165,822.20 |
| කඩුවෙල | 158 | 20,339,467.20 | 0 | 158 | 19,285,878.60 |
| කැස්බෑව | 60 | 8,497,756.90 | 0 | 60 | 7,939,026.58 |
| කොළඹ | 94 | 11,987,500.00 | 0 | 94 | 11,901,643.93 |
| රත්මලාන | 64 | 5,107,103.22 | 0 | 64 | 5,050,489.16 |
| මහරගම | 99 | 11,464,573.64 | 0 | 99 | 11,421,611.32 |
| පරිපාලන වියදම | | | | | 3,597,122.68 |
| එකතුව | **1,050** | **120,594,117.89** | **1** | **1,049** | **119,131,862.00** |

## මූල්‍ය හා භෞතික ප්‍රගතිය - අංශ අනුව

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් වූ ප්‍රතිපාදන රු. | භෞතික ප්‍රගතිය | | වියදම රු.මි |
|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් නොවූ | වැඩ අවසන් | |
| මාර්ග, පාලම්, බෝක්කු | 176 | 32.15 | 1 | 175 | 30.11 |
| ජල සම්පාදන | 9 | 1.23 | 0 | 9 | 1.16 |
| අධ්‍යාපන | 225 | 23.39 | 0 | 225 | 22.06 |
| සෞඛ්‍යය / සනීපාරක්ෂක පහසුකම් | 17 | 2.39 | 0 | 17 | 2.30 |
| වාරිමාර්ග | 2 | 0.15 | 0 | 2 | 0.15 |
| විදුලිය | 25 | 1.63 | 0 | 25 | 1.56 |
| ආගමික හා සංස්කෘතික | 309 | 30.42 | 0 | 309 | 28.80 |
| සමාජ සුභසාධන | 180 | 19.94 | 0 | 180 | 19.13 |
| ක්‍රීඩා පහසුකම් | 29 | 2.92 | 0 | 29 | 2.81 |
| වෙනත් | 78 | 5.89 | 0 | 78 | 7.45 |
| පරිපාලන වියදම් | 0 | | 0 | 0 | 3.60 |
| **එකතුව** | **1,050** | **120.11** | **1** | **1,049** | **119.13** |

# දිවි නැගුම වැඩසටහන - සවිබල ගෘහ ආර්ථිකයක්

2011 වර්ෂය සඳහා අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කල ප්‍රධාන අයවැය යෝජනාවක් වූයේ ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයක් පිහිටුවීම මඟින් පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීමයි. ඒ අනුව 'ඉසුරුමත් නිවහනක් - අසිරිමත් මවුබිමක්' යන තේමාව පදනම් කරගෙන දිවි නැගුම පළමු අදියර 2011 මාර්තු 12 වන දින ආරම්භ කෙරුණි.





සෞඛ්‍ය සම්පන්න සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයක් ස්ථාපිත කිරීම මෙහි ප්‍රධාන ඉලක්කය විය.

දිවිනැගුම වැඩසටහනේ දෙවන අදියර 2011 නොවැම්බර් මාසයේ ආරම්භ කෙරුණි.මේ යටතේ ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයක් ලෙස පළමු අදියර සඳහා වූ ඉලක්කය ගෘහ ඒකක විසිඑක් ලක්ෂයක් දක්වා වැඩි කරන ලදී.

## දිවිනැගුම ජාතික වැඩසටහනේ ප්‍රධාන අරමුණු :-

- ප්‍රතිලාභී පවුල්වල පෝෂණ මට්ටම ඉහල නැංවීම.
- ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- පවුලේ ආර්ථිකය සවිබල ගැන්වීම උදෙසා අතිරේක ආදායම් මාර්ග බිහි කිරීම.
- ජීවන වියදම අඩු කිරීම.



## දිවිනැගුම වැඩසටහන යටතේ ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර :-

- කෘෂි කාර්මික අංශය.
- පශු සම්පත් හා ධීවර අංශය.
- කර්මාන්ත අංශය.

### කෘෂිකාර්මික අංශය



කෘෂි කාර්මික අංශය දිවිනැගුම ජාතික ව්‍යාපාරයේ ප්‍රධානතම අංශය වේ. මෙමගින් ගෙවත්ත සංවර්ධනය කිරීම තම නිවසට අවශ්‍ය එළවළු , පළතුරු ගෙවත්තෙන්ම ලබා ගැනීමත් , එමගින් පවුලේ පෝෂණය ඉහල නැංවීමත් , ගෘහ ආර්ථිකය වර්ධනය කිරීමත් මෙරට දේශීය වගාවන් දිරි ගැන්වීමත් කෘෂි කාර්මික භෝග ආනයනය කිරීම අවම කිරීමත් අපේක්ෂා කෙරේ.



# 3. දිවි නැගුම වැඩසටහන - 2012

## ප්‍රතිලාභ බෙදාදීම

| අනු අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | පළතුරු | | සුළු අපනයන | | කජු පැල | | මිටි මුරුංගා | | පොල් පැල | | කිකිළි පැටව් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය |
| 01 | කොළඹ | 84 | 5190 | - | - | | | 60 | 3000 | - | - | 110 | 38500 |
| 02 | තිඹිරිගස්යාය | 1037 | 130260 | 270 | 3510 | | | 30 | 1500 | - | - | 180 | 59500 |
| 03 | කොලොන්නාව | 4250 | 610750 | 400 | 5600 | 500 | 83750 | 82 | 4100 | 250 | 18750 | 1710 | 598500 |
| 04 | දෙහිවල | - | - | 61 | 793 | | | 50 | 2500 | 175 | 13125 | 20 | 7000 |
| 05 | රත්මලාන | 2461 | 308330 | 102 | 1326 | | | 20 | 1000 | 10 | 750 | 560 | 196000 |
| 06 | මොරටුව | 2124 | 144930 | - | - | | | 74 | 3700 | - | - | 150 | 52500 |
| 07 | මහරගම | 2614 | 397760 | 247 | 3216 | | | 72 | 3600 | 427 | 32025 | 450 | 157500 |
| 08 | හෝමාගම | 8400 | 1068825 | 3100 | 48900 | 380 | 76000 | 152 | 7600 | 2987 | 224025 | 2350 | 822500 |
| 09 | පාදුක්ක | 7771 | 1108050 | - | - | | | 82 | 4100 | 500 | 37500 | 42500 | 1487500 |
| 10 | සීතාවක | 2010 | 118900 | 1000 | 13000 | | | 100 | 5000 | 4541 | 340575 | 500 | 175000 |
| 11 | කැස්බෑව | 7400 | 830000 | 6342 | 101472 | | | 136 | 6800 | 4879 | 365925 | 2100 | 735000 |
| 12 | කඩුවෙල | 6983 | 708955 | 1500 | 24000 | 824 | 164800 | 104 | 5200 | 2880 | 216000 | 1200 | 420000 |
| 13 | කෝට්ටේ | 1500 | 224100 | - | - | | | 38 | 1900 | - | - | 400 | 140000 |
| | එකතුව | **46634** | **5656050** | **13022** | **201817** | **1704** | **324550** | **1000** | **50000** | **16649** | **1248675** | **52080** | **4889500** |

## ද්‍රව්‍ය බෙදා දීම

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාශය | යෙදවුම් වර්ගය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | පෝච්චි | | පොහොර | | පස් | | මුළු වටිනාකම |
| | | භෞතික | මූල්‍ය (රු) | භෞතික (කි.ග්‍රෑ) | මූල්‍ය (රු) | භෞතික (කි.ග්‍රෑ) | මූල්‍ය (රු) | (රු.) |
| **01** | කොළඹ | 3384 | 389160 | 889 | 204470 | 1027 | 184860 | 778490 |

02 හෝමාගම ප්‍රා. ලේ කොට්ඨාශය - ආදර්ශ කෘෂි උපකරණ කට්ටල හා ගෙවතු සඳහා උපකරණ කට්ටල ලබා දීම සඳහා වියදම රු. 4034630 සහ මී මැසි පෙට්ටි 25 ක් ලබා දීම සඳහා වියදම රු. 20625 වේ.

## කර්මාන්ත සංවර්ධන වැඩසටහන ( පුහුණු හා උපකරණ බෙදා දීම)

| විස්තරය | අනුමතප්‍රතිපාදන(රු) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදනබෙදීයාම | **වියදම** |
|---|---|---|---|---|
| ගෘහ කර්මාන්ත සඳහා (2012/01/23) | | | | |
| (01) සුදු පොල් තෙල් මැෂින් බෙදා දීම සඳහා NERD ආයතනයට දීම (2012/01/23) / 105-02-1-1-2105(3) | 860,000 | 77 | 770,000 | 770,000 |
| (02) 2011 ගෘහ කර්මාන්ත ප්‍රතිලාභීන් සඳහා (2012/03/28) / 105-02-1-1-2105(3) | | | | |
| 1) පේෂ කර්මාන්ත හා ඇඟළුම් ආයතනය (TEXTILE) | 20,000 | 2 | 20,000 | 20,000 |
| 2) ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) | 60,000 | 6 | 60,000 | 60,000 |
| 3) ආතර් සී ක්ලාක් ආයතනය | 80,000 | 8 | 80,000 | 80,000 |
| 4) ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERD) | 260,000 | 26 | 260,000 | 260,000 |
| 5) කාර්මික තාක්ෂණ ආයතනය (ITI) | 310,000 | 31 | 310,000 | 310,000 |
| 6) ජාතික හස්ත කර්මාන්ත ආයතනය (NCC) | 390,000 | 34 | 340,000 | 340,000 |
| 7) කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) | 800,000 | 80 | 800,000 | 800,000 |
| 8) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය (SEDD) | 920,000 | 92 | 920,000 | 920,000 |
| 9) විද්‍යා ආයතනය | 990,000 | 99 | 990,000 | 990,000 |
| මුළු එකතුව (2011 ගෘහ කර්මාන්ත ප්‍රතිලාභීන් සඳහා) | 3,830,000 | 378 | 3,780,000 | 3,780,000 |

## ප්‍රාථමික පාසල් 5000 හා ද්විතීයික පාසල් 1000 ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන

### " හොඳම දේ දැයේ දරුවන්ටයි "

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව, ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීම හා දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනු වස් ද්විතීක පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් පන්දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක විය.

මෙම වැඩසටහනේ පළමු අදියර යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 තුල තෝරාගත් ප්‍රාථමික පාසල් 45 ක පහත සඳහන් ක්‍රියාකාරකම් වලට මූලිකත්වය ලබාදෙමින් ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 22.5 කි.

1. විදුලිබල පහසුකම් සැපයීම.
2. ජල පහසුකම් සැපයීම.
3. වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය.
4. පාසල් වැට හා ගේට්ටුව සකස් කිරීම.
5. පවතින ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීම හා තීන්තාලේප කිරීම.
6. පාසල් භූමිය ආදර්ශමත් ගෙවතු වගාවක් බවට පත් කිරීම.
7. පාසල් නාම පුවරුව සකස්කිරීම.
8. පළමු වසර සිසුන්ගේ ක්‍රියාකාරකම් කාමරයක් විධිමත් පරිදි සකස් කිරීම.
9. ළමා සෙල්ලම් මිදුල සකස් කිරීම.
10. ගුරුවරුන් දැනටමත් පදිංචි ගුරු නිවාසයක් ඇත්නම් එහි අත්‍යාවශ්‍ය අළුත්වැඩියා සිදු කිරීම.

| ප්‍රා.ලේ. කොට්ඨාශය | පාසල් සංඛ්‍යාව | වෙන්කල මුදල රු. | වියදම රු. |
|---|---|---|---|
| කොළඹ | 3 | 1,500,000.00 | 1,365,341.76 |
| තිඹිරිගස්යාය | 1 | 500,000.00 | 500,000.00 |
| කොලොන්නාව | 3 | 1,500,000.00 | 1,500,000.00 |
| ශ්‍රී ජපුර කෝට්ටේ | 3 | 1,500,000.00 | 1,475,080.01 |
| සීතාවක | 6 | 3,000,000.00 | 2,999,454.37 |
| පාදුක්ක | 4 | 2,000,000.00 | 1,889,856.17 |
| හෝමාගම | 5 | 2,500,000.00 | 2,473,644.11 |
| මහරගම | 1 | 500,000.00 | 498,552.22 |
| කඩුවෙල | 4 | 2,000,000.00 | 1,945,900.82 |
| රත්මලාන | 4 | 2,000,000.00 | 1,999,973.20 |
| දෙහිවල | 3 | 1,500,000.00 | 1,443,293.41 |
| මොරටුව | 5 | 2,500,000.00 | 2,413,082.62 |
| කැස්බෑව | 3 | 1,500,000.00 | 1,500,000.00 |
| එකතුව | 45 | 22,500,000.00 | 22,004,178.69 |

නිම කරන ලද ක්‍රියාකාරකම් කිහිපයයක්

**කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - සිංහල විද්‍යාලය (ප්‍රාථමික) - කොටහේන**





**තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - සීවලී මහා විද්‍යාලය**



# 4. ප්‍රාථමික පාසල් පන්දහසක් හා ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන - 2012

| ප්‍රා.ලේ. කොට්ඨාශය | පාසල් සංඛ්‍යාව | වෙන්කල මුදල රු. | වියදම රු. |
|---|---|---|---|
| කොළඹ | 3 | 1,500,000.00 | 1,365,341.76 |
| තිඹිරිගස්යාය | 1 | 500,000.00 | 500,000.00 |
| කොලොන්නාව | 3 | 1,500,000.00 | 1,500,000.00 |
| ශ්‍රී ජපුර කෝට්ටේ | 3 | 1,500,000.00 | 1,475,080.01 |
| සීතාවක | 6 | 3,000,000.00 | 2,999,454.37 |
| පාදුක්ක | 4 | 2,000,000.00 | 1,889,856.17 |
| හෝමාගම | 5 | 2,500,000.00 | 2,473,644.11 |
| මහරගම | 1 | 500,000.00 | 498,552.22 |
| කඩුවෙල | 4 | 2,000,000.00 | 1,945,900.82 |
| රත්මලාන | 4 | 2,000,000.00 | 1,999,973.20 |
| දෙහිවල | 3 | 1,500,000.00 | 1,443,293.41 |
| මොරටුව | 5 | 2,500,000.00 | 2,413,082.62 |
| කැස්බෑව | 3 | 1,500,000.00 | 1,500,000.00 |
| **එකතුව** | **45** | **22,500,000.00** | **22,004,178.69** |

## පළාත් මාර්ග වැඩ සටහන

මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහනෙහි සමස්ථ සංවර්ධන වැඩපිළිවෙලට අදාළව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන 2011 යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග 103 ක් සංවර්ධනය, කාර්යක්ෂම ගමනාගමනය හා අන්තර් පළාත් සම්බන්ධතාවය තහවුරු කිරීම උදෙසා දායක වී ඇත.

මෙම වැඩසටහනේ පාර්ශවකරුවන් ලෙස,

| ආයතනය | දායකත්වය |
|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | අනුමැතිය හා ප්‍රතිපාදන ලබා දීම. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මෙහෙයවීම, සම්බන්ධීකරණය, කළමනාකරණ අධීක්ෂණය |
| මාර්ග සංවර්ධන අධිකාරිය | තාක්ෂණික අධීක්ෂණය |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | ක්‍රියාත්මක කිරීම |

**මේ වන විට මූල්‍ය හා භෞතික වශයෙන් අවසන් ඉලක්ක වෙමින් පවතින මෙම වැඩසටහනෙන් අපේක්ෂිත ඉලක්ක,**

- අපේක්ෂිත ප්‍රවාහන කාර්යක්ෂමතාව මඟින් දිස්ත්‍රික්කයේ මාර්ග තදබදය අවම කිරීම,
- ග්‍රාමීය නිෂ්පාදන වෙළඳපොල වෙත ගෙන ඒමේ පහසුව,
- යටිතල පහසුකම්හි ප්‍රමුඛ අංගයක් වූ මාර්ග පද්ධතිය ක්‍රමානුකූල කිරීම හා නගර සැලසුමට අලංකාරත්වයක් එක් කිරිම,
- සංචාරක කර්මාන්තයේ දී වාණිජ්‍ය අගනගරය ලෙස කොළඹ හා දිස්ත්‍රික්කයේ සෙසු නගර අතර ගමනාගමනය ආකර්ශනීය කිරීම.

ආදී වූ සමබර ආර්ථික වර්ධනයට මෙන්ම සමාජීය සංවර්ධනයටත් රුකුල් සපයයි.

## පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන - 2011

- ව්‍යාපෘති සංඛ්‍යාව - 103
- වෙන් කළ ප්‍රතිපාදන මුදල - රු.2,293,596,772.02
- ක්‍රියාත්මක කොට්ඨාශ - කොළඹ, මොරටුව, අවිස්සාවේල්ල යන ඉංජිනේරු කොට්ඨාශ වලට යටත්ව කොලොන්නාව, කඩුවෙල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහරගම, මොරටුව, රත්මලාන, කැස්බෑව, දෙහිවල, පාදුක්ක, හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල මෙම මාර්ග කාපට් කිරිමේ වැඩසටහන නිම වෙමින් පවතී.

# පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන - 2011

| ඉංජිනේරු කොට්ඨාශය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | යෝජිත දුර ප්‍රමාණය | 2012/12/31 දිනට ගෙවීම් (රු.මි.) |
|---|---|---|---|---|
| කොළඹ | කොලොන්නාව | 19 | 22.95 | 195.4375 |
| | කඩුවෙල | 11 | 23.09 | 123.68494 |
| | කෝට්ටේ | 10 | 11.29 | 118.6315 |
| මොරටුව | මහරගම | 13 | 18.83 | 180.1428 |
| | මොරටුව | 9 | 5.08 | 54.06342 |
| | රත්මලාන | 5 | 3.73 | 41.4086 |
| | කැස්බෑව | 10 | 28.13 | 248.3768 |
| | දෙහිවල | 7 | 6.71 | 64.22344 |
| අවිස්සාවේල්ල | පාදුක්ක/ සීතාවක | 11 | 27.33 | 289 |
| | හෝමාගම | 8 | 26.47 | 250.724 |
| එකතුව | | **103** | **173.61** | **1565.69** |





හෝමාගම - මුල්ලේගම හබරකඩ පාර

# 04. සමෘද්ධි අංශය

ශ්‍රී ලංකාවේ වෙසෙන අඩු ආදායම්ලාභී සහ ආවාසි සහගත කණ්ඩායම් වලට ඇතුලත් වන පුද්ගල පවුල් කණ්ඩායම් සහ ප්‍රජාවගේ දිළිඳු බව තුරන් කිරීම සහ සමාජ සාධාරනත්වය සහතික කරනු ලබන සමාජයක් බිහිකිරීම සඳහා අවශ්‍ය වන ප්‍රජාව කේන්ද්‍ර කොට ගත් සංවර්ධන වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන හැඳින්විය හැක.

එසේම ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, පවුල් වෙනුවෙන් ආහාර සුරක්ෂිත තාවය සහතික කිරීම, ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ දැමීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම ඉතුරුම් ක්‍රියාවලිය සඳහා ප්‍රජාව යොමු කරමින් ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියක් පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය කිරීම මගින් ප්‍රජා මට්ටමේ ජාතික සංවර්ධනය ක්‍රියාවලියනට ජනතාව ඒකරාශී කිරීම ප්‍රජාවගේ භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, හා පුද්ගල හා පවුල කේන්ද්‍ර කොටගෙන දිරිය පියස නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරී ම,අඩු ආදායම් පවුල් වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා දරුවන්ගේ දක්ෂතා ඔප්නැංවීම සඳහා කැකුළු ළමා සමාජ ක්‍රියාත්මක කිරීම හා භරග සංවිධානය කිරීම , සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ආකල්ප සංවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභී වැඩසටහන් සඳහා සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ජාතික සංවර්ධන ක්‍රියාවලියකට ජනතාව ඒකරාශී කිරීමට දිවිනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දායක වීම වශයෙන් පුද්ගලයන්ගේ සිට පවුල , ප්‍රජාව හා ගම සංවර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් සමෘද්ධි වැඩසටහන මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. ක්‍රියාත්මක වේ.

## ක්‍රියාත්මක වන වැඩසටහන්

1) බැංකු වැඩසටහන

* ඉතුරුම් ක්‍රියාවලිය - තැන්පතු පවත්වාගෙන යාම, සාමාජික, සාමාජික නොවන, කණ්ඩායම්, දිරියමාතා,ළමා සිසුරක, කැකුළු, අනිවාර්ය

* ණය වැඩසටහන - ස්වයං රැකියා ණය , නිවාස ණය, පාරාභෝගික ණය, ආපදා, මිහිජය, කිරුළ, දිවිනැගුම, ඉසුර

2) සමාජ සංවර්ධන වැඩසටහන

* දිරිය පියස නිවාස වැඩ සටහන

* මත් ද්‍රව්‍ය නිවාස වැඩසටහන

* ළමා සමාජ වැඩසටහන

3) සමාජ ආරක්ෂණ වැඩසටහන

4) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

5) දිවිනැගුම ගෙවතු වැඩසටහන

6) සමෘද්ධි සහනාධාර වැඩසටහන

කොළඹ දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි වැඩසටහන ග්‍රාමනිලධාරී වසම් 557ක්, බැංකු සංගම් 42ක් මගින් ක්‍රියාත්මක ව සමෘද්ධි කළමනාකරුවන් 69ක් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 868ක් මේ සඳහා සේවයේ යොදා ඇත.

## දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන - ව්‍යාපෘති ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘති වර්ගය | ඒකක වටිනාකම | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **1** | ආරක්ෂිත ගෘහ | 80,000/- | 106 | 8,480,000/- | 100% |
| **2** | විසිතුරු මල් | 25,000/- | 62 | 1,550,000/- | 100% |
| **3** | මී මැසි | 2,000/- | 30 | 60,000/- | 100% |
| **4** | විසිතුරු මසුන් | 36,000/- | 15 | 540,000/- | 100% |
| **5** | එළු පාලනය | 15,000/- | 10 | 150,000/- | 100% |
| **6** | ගව ගාල් | 35,000/- | 60 | 2,100,000/- | 100% |
| **7** | බිම් මල් | 10,000/- | 83 | 830,000/- | 100% |
| | **එකතුව** | **203,000/-** | **366** | **13,710,000/-** | **100%** |

## දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන - ප්‍රතිපාදන ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන | = | රු. | 14,495,000.00 |
| ව්‍යාපෘති සඳහා දරන ලද ප්‍රතිපාදන | = | රු. | 13,710,000.00 |
| ප්‍රතිපාදන ප්‍රගතිය | = | රු. | 785,000.00 |

මීගොඩ කලාපය- එච්.එස්.සිසිරලතා මිය



ලිලියන් පෙරේරා-වැවල බටහිර



## දිවි නැගුම ජීවනෝපාය චක්‍රීය අරමුදල

**2012.12.31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉතිරි ශේෂය**

| | ප්‍රා.ලේ.කොට්ඨාශය | 2012.12.31 දිනට අයකර ගත යුතු මුදල | | 2012.12.31 දිනට අයකර ගත් මුදල | | ණය අයකර ගැනීමේ ප්‍රගතිය % | 2012.12.31 දිනට ප්‍රා.ලේ.කොට්ඨාශ මට්ටමින් ඉතිරි ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශත | රු. | ශත | | රු. | ශත |
| **1** | කොළඹ | 176,616 | 50 | 66,994 | 00 | 38 % | 358,873 | **25** |
| **2** | ශ්‍රී.ජපුර | 835,357 | 00 | 514,374 | 25 | 62 % | 894,358 | **12** |
| **3** | තිඹිරිගස්යාය | 00 | 00 | 00 | 00 | 00 | 418.481 | **25** |
| **4** | කොලොන්නාව | 3,185,053 | 00 | 1,263,212 | 00 | 40 % | 4,464,392 | **25** |
| **5** | කඩුවෙල | 3,232,075 | 50 | 1,688,735 | 00 | 52 % | 3,565,025 | **68** |
| **6** | සීතාවක | 1,200,790 | 00 | 766,904 | 50 | 64 % | 3,775,088 | **25** |
| **7** | පාදුක්ක | 1,651,728 | 50 | 903,733 | 00 | 55 % | 1,814,991 | **.26** |
| **8** | හෝමාගම | 3.724,844 | 00 | 1,800,992 | 00 | 48 % | 5,513,508 | **00** |
| **9** | මහරගම | 1,459,357 | 00 | 489,650 | 00 | 34 % | 1,286,574 | **54** |
| **10** | දෙහිවල | 938,979 | 00 | 799,788 | 00 | 85 % | 1,140,664 | **42** |
| **11** | රත්මලාන | 1.232,146 | 00 | 464,142 | 00 | 38 % | 1,141,824 | **00** |
| **12** | මොරටුව | 1,593,774 | 00 | 1,150,471 | 00 | 72 % | 2,324,017 | **25** |
| **13** | කැස්බෑව | 3,940,862 | 54 | 2,082,431 | 18 | 53 % | 2,768,671 | **01** |
| | **එකතුව** | 23,171,583 | 04 | 11991426 | 93 | 52 % | 29,466,469 | 28 |

# සමාජ ආරක්ෂණ වැඩ සටහන

සමාජ ආරක්ෂන වැඩසටහනයටතේ සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල්වල පහත අවස්ථාවලදී ප්‍රතිලාභ ලබාදෙනු ලබයි.

1.උපත් සඳහා

2.විවාහ සඳහා

3.මරණ සඳහා

| අනු අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | වර්ෂය තුළ ලබාදෙන ලද අත්තිකාරම් මුදල | 2012.12.31 දිනට වර්ෂය පුරා ප්‍රතිපූර්ණය කර ප්‍රතිපාදන ගෙවීම් | වෙනත් |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 357,000.00 | 1463,225.00 | 2012 වර්ෂයේ අත්තිකාරම් ලෙස ලබා දෙන ලද මුදල් වර්ෂය තුළ ප්‍රතිපූර්ණය කිරීමේ හේතුව මත ප්‍රතිපාදන ගෙවීම් ශේෂය වැඩි වී ඇත. |
| 2 | ශ්‍රීජයවර්ධනපුර | 147,000.00 | 240,000.00 | |
| 3 | තිඹිරිගස්යාය | 298,000.00 | 379,400.00 | |
| 4 | කොලොන්නාව | 898,000.00 | 774,779.60 | |
| 5 | කඩුවෙල | 801,000.00 | 989,700.00 | |
| 6 | සීතාවක | 840,000.00 | 878,380.00 | |
| 7 | පාදුක්ක | 850,000.00 | 556,700.00 | |
| 8 | හෝමාගම | 707,000.00 | 958,200.00 | |
| 9 | මහරගම | 242.000.00 | 623,394.00 | |
| 10 | දෙහිවල | 129,000.00 | 354,534.00 | |
| 11 | රත්මලාන | 206.000.00 | 310.200.00 | |
| 12 | මොරටුව | 464.000.00 | 1,365,665.00 | |
| 13 | කැස්බෑව | 844,400.00 | 825.600.00 | |
| | දි.ලේ.කා. | 1,204,000.00 | | |
| | **එකතුව** | 7,987,400.00 | 9,719.777.60 | |

# සමාජ සංවර්ධන වැඩසටහන

## දිරිය පියස නිවාස සංවර්ධන වැඩ සටහන

දිරිය පියස නිවාස වැඩසටහන යටතේ ජීවත්වීමට සුදුසු තත්වයේ නිවසක් නොමැති පවුල් සඳහා ජීවත්වීමට සුදුසු තත්වයේ නිවසක් ඉදිකරදීමට රු.100,000/- ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභීන් 136 දෙනෙකු සඳහා 2012 වසර තුල රු.11,000,000/- ක මුදලක් ලබාදෙන ලදී.

| අනුඅංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | අනුමත නිවාස ගණන | අනුමත මුදල රු. |
|---|---|---|---|
| 1 | කඩුවෙල | 8 | 730,000.00 |
| 2 | සීතාවක | 19 | 1,750,000.00 |
| 3 | හෝමාගම | 16 | 1,282,929.00 |
| 4 | මහරගම | 13 | 1,050,000.00 |
| 5 | කැස්බෑව | 17 | 1,425,000.00 |
| 6 | කොලොන්නාව | 18 | 1,120,000.00 |
| 7 | කොළඹ | 10 | 910,000.00 |
| 8 | දෙහිවල | 4 | 325,000.00 |
| 9 | මොරටුව | 7 | 462,071.00 |
| 10 | ජයවර්ධනපුර | 4 | 350,000.00 |
| 11 | තිඹිරිගස්යාය | 2 | 200,000.00 |
| 12 | පාදුක්ක | 11 | 975,000.00 |
| 13 | රත්මලාන | 7 | 420,000.00 |
| | **එකතුව** | **136** | **11,000,000.00** |

| |
|---|
| රාජ්‍ය බැංකු වල කරන ලද ආයෝජන ප්‍රතිශතය - **92 %** |
| රාජ්‍ය නොවන බැංකු වල කරන ලද ආයෝජන ප්‍රතිශතය - **8 %** |

**1. කුසුමාවතී රාජපක්ෂ මිය - බොරලැස්ගමුව නැගෙනහිර බී වසම**



පෙර තත්වය



පසු තත්වය

**2 සම්මු නිලන්ති මිය - නිවනිතිඩිය**



පෙර තත්වය



පසු තත්වය

# 2012.12.31 දිනට වර්ෂ අවසාන වියදම් ප්‍රකාශය

| අනු අංකය | විස්තරය | වර්ෂය තුළ ලැබූ ප්‍රතිපාදන | වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. | **වැටුප් හා වේතන** | | | |
| 1. | ලිපිකරු වැටුප් | 213,822.00 | 61,091.46 | 28.57 % |
| 2. | සමෘද්ධි කලමණාකරු වැටුප් | 35,780,745.00 | 35.780,743.39 | 100 % |
| 3. | සමෘද්ධි සංවර්ධන නිලධාරි වැටුප් | 299,553,310.00 | 299,523,212.78 | 99.99 % |
| 4. | දීමනා | 362,400.00 | 358.800.00 | 99.01 % |
| 2. | **පරිපාලන වියදම්** | | | |
| 1. | අතිකාල | 129,239.00 | 105,631.22 | 81.73 % |
| 2. | ගමන් වියදම් | 4,183,400.00 | 2,880,167.50 | 68.85 % |
| 3. | ලිපි ද්‍රව්‍ය | 85,800.00 | 84,647.63 | 98.66 % |
| 4. | ඉන්දන | 210,070.00 | 209,970.00 | 99.95 % |
| 5. | වාහන අලුත් වැඩියා | 159,025.00 | 159,025.00 | 100 % |
| 6. | කාර්යාල උපකරණ | 8,780.00 | 8,779.68 | 100 % |
| 7. | දුරකථන බිල් | 225,507.00 | 199,373.34 | 88.41 % |
| 8. | තැපැල් ගාස්තු | 111,150.00 | 98,172.00 | 88.32 % |
| 9. | බැංකු ගාස්තු | 4509.00 | 4,509.00 | 100 % |
| 3. | ග්‍රාම සංවර්ධන වැඩ සටහන | 500,000.00 | 495,498.62 | 99.10 % |
| 4. | සමාජ සංවර්ධන වැඩ සටහන | 211,625.00 | 211,625.00 | 100 % |
| 5 | කෘෂි සංවර්ධන වැඩ සටහන | 98,300.00 | 97,426.00 | 99.11 % |
| 6. | මහා සංගම් වැඩ සටහන | 1,310,948.00 | 1,160,948.00 | 88.56 % |
| 7. | මානව සම්පත් හා ආයතනික වැඩ සටහන | 223,240.00 | 197,540.00 | 88.49 % |
| 8. | මෙහෙයුම් ඇගයුම් වැඩ සටහන | 24,852.00 | 210,542.72 | 84.72 % |
| 9. | ප්‍රාග් ධන වියදම් | 219,890.00 | 178,040.00 | 80.97 % |
| 10. | බැංකු මූල්‍ය අංශයේ වියදම් | 1,196,643.00 | 1,032,114.50 | 86.25 % |
| 11. | සමෘද්ධි නිවාස ලොතරැයි වියදම් | 21,061.875.00 | 21,061,875.00 | 100 % |
| | **එකතුව** | **365,874,730.00** | **364,119,732.84** | 100 % |

## 2012.12.31 දිනට සමෘද්ධි බැංකු සංගම්හි තැන්පතු වර්ගයන්හි ප්‍රගතිය

| අනු අංකය | තැන්පතු වර්ගය | ගිණුම් ප්‍රමාණය | මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 1 | කොටස් ගිණුම | 129,626 | **245,490** |
| 2 | සාමාජික තැන්පතු ගිණුම | 126,471 | **510,775** |
| 3 | ළමා තැන්පතු ගිණුම | 41,964 | **49,282** |
| 4 | දිරිය මාතා තැන්පතු ගිණුම | 35,186 | **80,412** |
| 5 | සාමාජික නොවන තැන්පතු ගිණුම | 16,459 | **80,661** |
| 6 | සමූහ තැන්පත් ගිණුම (කණ්ඩායම් ගිණුම) | 16,243 | **456,417** |
| 7 | අනිවාර්ය ඉතිරි කිරීමේ ගිණුම | 70,128 | **558,385** |
| 8 | සිසුරක ඉතිරි කිරීමේ ගිණුම | 4,230 | **6,214** |
| | එකතුව | 440,307 | 1,987,637 |

## 2012.12.31 දිනට කොළඹ දිස්ත්‍රික්කයේ ආයෝජන ප්‍රගතිය

| අනු අංකය | ආයෝජනය කරන ලද ආයතනය | ආයෝජන වර්ගය | | එකතුව |
|---|---|---|---|---|
| | | භාණ්ඩාගාර බිල් පත් | ස්ථාවර තැන්පතු | |
| 1 | ලංකා බැංකුව | 459,294,041.15 | 2329,169,52.90 | **692,210,994.00** |
| 2 | මහජන බැංකුව | 61,710,903.47 | 646518,944.97 | **708,229,848.44** |
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | - | 24,024,500.00 | **24,024,500.00** |
| 4 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | 105,325,911.77 | **105,325,911.77** |
| 5 | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | - | 13,493,528.37 | **13,493,528.37** |
| | එකතුව | 521,004,944.62 | 1,022,279,838.01 | 1,543,284,782.63 |

# 05. ඉංජිනේරු අංශය

## කාර්යභාරය

1. ඉදිකිරීම් කටයුතු කිරිම.
   - සැලසුම් සකස් කිරිම.
   - ඇස්තමේන්තු සකස් කිරිම.
   - වැඩබිම් අධීක්ෂණය කිරිම.
   - බිල්පත් පරික්ෂා කිරිම.
   - ගෙවීම් නිර්දේශ කිරිම.
2. අළුත් වැඩියා කටයුතු සිදුකිරිම.
3. නඩත්තු කටයුතු කිරිම.
4. දිස්ත්‍රික් මිල නියම කිරිමේ කමිටුව පැවත්වීම.
5. සැපයුම් කරුවන් ලියාපදිංචි කිරිම.

## අංශය මඟින් සිදුකරන ලද කාර්යභාරය

1. තට්ටු 20 න් සමන්විත නාරාහේන්පිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සංකීර්ණයේ තුන්වන සහ හතරවන මහල් ඉදිකිරිම් කටයුතු ගිවිසුමට අනුව නිමකිරිම.
   (සම්පුර්ණ ඇස්තමේන්තුව රු.මිලියන 1400, දැනට වියදම රු.මිලියන 687 )
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන හා සැලසුම් අංශ සඳහා විදුලි බලය ලබා දිමට කටයුතු කිරිම. වියදම රු.250,132.14
3. දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය අළුත් වැඩියා කිරිම. වියදමරු.93,805.00
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යාලයේ විදුලි පංකා සවි කිරිම. වියදම රු. 50,000
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරකථන පද්ධතිය අළුත්වැඩියා කිරිම රු.37,361.00
6. දිසාපති නිල නිවාසයේ තාප්පය අළුත්වැඩියා කිරීම හා ගේට්ටු දෙකක් සවි කිරීම වැය කල මුදල රු. 539,411.07
7. සහකාර දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.වියදම රු. 46,619.60
8. සහකාර දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.වියදම රු. 222,542.60

## 06. පුපුරණ ද්‍රව්‍ය අංශය

2012 වර්ෂයේ පුපුරණ ද්‍රව්‍ය අංශයේ කාර්ය සාධනය පහත සඳහන් පරිදි වේ.

| කාර්යය | ප්‍රමාණය | මුදල රු. |
|---|---|---|
| පුපුරණ ද්‍රව්‍ය අවසරපත් නිකුත් කිරීම | 256 | 64,000.00 |
| පුපුරණ ද්‍රව්‍ය සපයන්නන්ගේ බලපත්‍ර | 319 | 79,750.00 |
| පුපුරණ ද්‍රව්‍ය ආනයනකරුගේ බලපත්‍ර | 05 | 25,000.00 |
| පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදකයාගේ බලපත්‍ර | 04 | 3,500.00 |
| පුපුරණ ද්‍රව්‍ය අපනයනකරුගේ බලපත්‍ර | 01 | 1,000.00 |
| ආරක්ෂක නියෝජ්‍ය ආයතන ලියාපදිංචිය | 141 | 141,000.00 |
| ගිනි අවි බලපත්‍ර | 5476 | 26,56,740.00 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ | 242 | -- |
| වාරික ලිපි නිකුත් කිරීම | 6552 | -- |
| පතුරොම් නිකුත්කිරීම | 286 | -- |
| ප්‍රවාහණ අවසරපත්‍ර නිකුත් කිරීම | 65 | - |
| එකතුව | | 2970990.00 |

පුපුරණ ද්‍රව්‍ය අංශය මඟින් ලද වාර්ෂික ආදායම පහත පරිදි වේ.



# 07. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය

**කාර්ය භාරය**

1. වෙළදුන් සතුව ඇති වෙළදාමට භාවිතා කරන කිරුම් පඩි, මිමි, කිරුම් සහ මිණුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කිරීම සහ සත්‍යාපන ලකුණින් පරීක්ෂකවරයෙකු මුද්‍රා තැබීම.

- දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම (දිස්ත්‍රික්කය තුළ) වෙළදුන්ගේ කිරුම් සහ මිණුම් උපකරණ සත්‍යාපනය කොට මුද්‍රා තැබීම සඳහා මුද්‍රා තැබීමේ මධ්‍යස්ථාන සංවිධානය කිරීම.
- ඉන්ධන පිරවුම්හල් වල ඇති ඉන්ධන නිකුත් කරන උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කොට මුද්‍රා තැබීම.
- වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථානවල ඇති වායු විමෝචනය පරීක්ෂන කෙරෙන උපකරණවල ද්‍රව්‍ය සංයුතිය පරික්ෂා කිරීම සහ වාර්ෂිකව සත්‍යාපනය කිරීම.
- කර්මාන්තශාලා වල ඇති කිරුම් උපකරණ සහ මිණුම් උපකරණ ද එහි භාවිතා කරන ව්‍යවස්ථාපිත මිමි වාර්ෂිකව සත්‍යාපනය කොට මුද්‍රා තැබීම.

2. 1995 අංක 35 දරණ මිණුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය කරන වංචනික වෙළදුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැටලීම් සිදුකිරීම. (37,42,38,46,51,(6) වගන්තීන්)

3. ඉහත සඳහන් කල නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය කරන වෙළදුන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.

| | |
|---|---|
| 1. මුද්‍රා තබන ලද ඒකක ගණන | - 34954 |
| 2. මුළු ආදායම | - රු.9130207.50 |
| 3. අවසන්වූ නඩු සංඛ්‍යාව | - 76 |
| 5. දඩ මුදල | - රු.148500.00 |

# 08. දිස්ත්‍රික් ක්‍රීඩා අංශය

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සමන්විත ලියාපදිංචි ක්‍රීඩා සමාජ ගණන 494 කි. පවත්වන ලද තරඟ විස්තර පහත දැක්වේ.

| | තරඟාවලියේ නම | සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගණන |
|---|---|---|
| 1 අදියර | අන්තර් ක්‍රීඩා සමාජ තරඟ | 40,500 |
| 2 අදියර | අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තරඟ | 17,500 |
| 3 අදියර | අන්තර් දිස්ත්‍රික් ක්‍රීඩා තරඟ (බස්නාහිර පළාත්) | 8,000 |
| 4 අදියර | ජාතික මහා ක්‍රීඩා උළෙල | 450 |

දිස්ත්‍රික් ක්‍රීඩා අංශය වෙත ප්‍රතිපාදන ලැබී ඇති ආකාරය

| ව්‍යාපෘතිය | ලබාදුන් ප්‍රතිපාදන | |
|---|---|---|
| | බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ජාතික මහා ක්‍රීඩා උළෙල<br>පළමු අදියර - අන්තර් ක්‍රීඩා සමාජ තරඟ | 780,000 | 130,000 |
| පාසැල් කණිෂ්ඨ තරඟ | 130,000 | |
| ජාතික මහා ක්‍රීඩා උළෙල දෙවන අදියර - අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තරඟ | 600,000 | 130,000 |
| ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට උපහාර උළෙලක් පැවැත්වීම | 150,000 | |
| ක්‍රීඩා පිටි සංවර්ධනය | | 3,000,000 |
| ජාත්‍යන්තර තරඟවලට සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අධාර ලබා දීම | 500,000 | |

## 09. මාධ්‍ය ඒකකය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් මීට වසර 12කට ඉහතදී දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් මාධ්‍ය ඒකක පිහිටුවන්නට යෙදුණි. ඒ අනුව සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල මෙම ප්‍රවෘත්ති අංශ ස්ථාපිත කළේය. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේද කොළඹ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය නමින් ප්‍රවෘත්ති අංශයක් පිහිටුවිය.

දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මඟින් රජය බලාපොරොත්තු වූයේ දිස්ත්‍රික්කයේ සිදුවන සංවර්ධන කටයුතු සම්බන්ධව ප්‍රචාරාත්මක වැඩපිළිවෙලක් ජනතාව අතරට ගෙනයාමය. රජය මඟින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම මෙමඟින් බලාපොරොත්තු විය. මේ සඳහා රාජ්‍ය මාධ්‍ය මෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදාගැනීම සිදු විය.

කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා යොදා ගැනෙන විමධ්‍යගත පළාත්සභා හා වෙනත් ප්‍රතිපාදන යොදාගෙන දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය එහි ගැටළු සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ දත්ත හඳුනාගෙන ඒවා සියලුම මාධ්‍යවලට ලබාදීම මෙම අංශය මඟින් සිදුකරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි. විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම්වරයාගේ මෙහෙයුම හා අධීක්ෂණය යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම් හා සම්බන්ධීකරණ කමිටු රැස්වීම් යනාදියට සහභාගී වී එහි තොරතුරු ලබා ගැනීම සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන් සම්බන්ධීකරණය කර අදාල තොරතුරු ලබා දීමට ද කටයුතු කරයි. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හිම පැවැත්වෙන රැස්වීම් වැඩමුළු හා උත්සව සම්බන්ධීකරණය කර එම තොරතුරු මාධ්‍යවලට ලබාදීම ද මෙහි තවත් කාර්යයකි.

මෙම කාලය තුළදී කොළඹ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මඟින් දිසාපතිවරයාගේ අනුදැනුමට යටත්ව පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

01. සියලු කමිටු රැස්වීම් ආවරණය කිරීම හා තොරතුරු මාධ්‍ය වලට නිකුත් කිරීම
02. කොළඹ දිස්ත්‍රික් ක්‍රමෝපායන් සංවර්ධන සැලැස්ම පිළිබඳ පැවති සියලුම වැඩමුළු ආවරණය කිරීම
03. කොළඹ දිස්ත්‍රික් රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය මඟින් සිදුකරනු ලබන තරඟාවලීන් සම්බන්ධව ආවරණ කටයුතු ලබාදීම හා මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීම
04. දෛනිකව මුද්‍රිත මාධ්‍ය වල පලවන වාර්තා ඒකරාශී කිරීම
05. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත විවිධ අංශ වල සංවර්ධන ක්‍රියාකාරකම් හා සම්බන්ධීකරණය වීම හා අදාළ වාර්තා මාධ්‍ය වලට නිකුත් කිරීම.

ඉදිරියේදී කොළඹ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මඟින් සිදු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන්.

- මාස 3කට වරක් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම
- දිසාපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ සාමාජික මාධ්‍ය වැඩසටහනක් පැවැත්වීම(මාසිකව)
- මාධ්‍ය තොරතුරු ඒකකයක් ඇති කිරීම
- මාධ්‍ය වැඩමුළු පැවැත්වීම
- ත්‍රෛමාසික මාධ්‍ය සඟරාවක් පල කිරීම

# 10. සංඛ්‍යාලේඛණ අංශය

**කාර්යභාරය :-**

01 සංගණන කටයුතු

02 සමීක්ෂණ කටයුතු

03 සාමාන්‍ය දත්ත රැස් කිරීමේ කටයුතු

04 වාර්ෂික සංඛ්‍යාලේඛන අත්පොත සකස් කිරීම

05 විශේෂ දත්ත රැස් කිරීම් කටයුතු

## 01 සංගණන කටයුතු

a. ජන හා නිවාස සංගණනය
b. කෘෂිකාර්මික සංගණනය
c. කර්මාන්ත සංගණනය
d. වෙළඳ හා සේවා සංගණනය

## 02 සමීක්ෂණ කටයුතු

a. වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම
b. ශ්‍රම බල සමීක්ෂණ කටයුතු
c. ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය
d. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය
e. ත්‍රෛ මාසික කාර්මික නිෂ්පාදන සමීක්ෂණය
f. වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය
g. පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය

## 03 සාමාන්‍ය දත්ත රැස් කිරීම් කටයුතු (සතිපතා/මාසිකව/කන්න/කාර්තු/වාර්ෂික වශයෙන්)

a. වී සංඛ්‍යාලේඛන
b. ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන
c. සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන
d. මස් පිණිස මරණ ලද සතුන්ගේ සංඛ්‍යාලේඛන
e. ගොඩනැගිලි සංඛ්‍යාලේඛන
f. පළාත් පාලන ආයතන සංඛ්‍යාලේඛන
g. නාගරික සිල්ලර මිල රැස් කිරීම
h. නිෂ්පාදකයාගේ මිල රැස් කිරීම

## 04. වාර්ෂික සංඛ්‍යාලේඛන අත්පොත සකස් කිරීම

ප්‍රා.ලේ. කොට්ඨාශ වලට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් මගින් අදාල යාවත්කාලීන ප්‍රාදේශීය දත්ත ලබා ගෙන එමගින් මෙම අත්පොත සකස් කිරීම

## 05. විශේෂ දත්ත රැස් කිරීම් කටයුතු

දෙපාර්තමේන්තුව විසින් පවරන ලද වෙනත් විශේෂ සමීක්ෂණ කටයුතු සහ දත්ත රැස් කිරීමේ කටයුතු

උදා :- 01 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ ගුණාත්මක සමීක්ෂණය - 2012 අගෝ:/සැප්:

02 ජාත්‍යයන්තර මිල සංසන්ධණාත්මක වැඩ සටහන

## 01 සංගණන කටයුතු

### 01a. ජන හා නිවාස සංගණනය - 2011/2012

1871 වර්ෂයේ සිට පවත්වා ගෙන ආ ජන හා නිවාස සංගණන මාලාවේ 14 වෙනි සංගණනය වූ මෙම සංගණනය 2012 පෙබරවාරි 27 සිට මාර්තු 21 දින දක්වා පැවැත් වූ අතර මාර්තු 19 දින මධ්‍යම රාත්‍රී 12.00 සංගණන මොහොත ලෙස පදනම් කරගෙන සිදු කරන ලදී. වසර 30 කට පසුව මුළු දිවයිනම ආවරණය වන අයුරින් පවත්වන ලද මෙම සංගණනය, ඉතිහාසයෙහි ප්‍රථම වතාවට පුද්ගලයින් ගණන් ගැනීම සාමාන්‍ය පදිංචි ස්ථාන පදනම් කර ගෙන නීති ප්‍රකාරගණනක්‍රමය (De Jure) අනුව සිදු කරන ලදී.

කොළඹ දිස්ත්‍රික්කයේ ඇති සංකීර්ණ තත්වයන් හමුවේ සංගණනය සඳහා 9500 කට ආසන්න නිලධාරීන් පිරිසක් යෙදවීමට සිදු විය. මෙම සංගණනයේ දී ගණන් ගන්නා නිලධාරීන් සහ අධීක්ෂණ නිලධාරීන් වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින්, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල සහ සමාජ සේවා විද්‍යාල වලින් තෝරා ගත් පිරිස සහ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, බන්ධනාගාර, රෝහල්, සහ නේවාසිකාගාර වැනි විශේෂ ආයතන සඳහා ඒ තුලින් තෝරා ගත් නිලධාරීන් ඇතුළුව අටදහසක පමණ නිලධාරීන් ප්‍රමාණයක්යොදවන ලදී. මෙම නිලධාරීන්ට 2012 ජනවාරි / පෙබරවාරි මාස වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංගණන කටයුතු පිළිබඳ මනා පුහුණුවක් ලබා දීම සිදු කරන ලදී.

සංගණන කොමසාරිස් ලෙස දිස්ත්‍රික් ලේකම් / දිසාපති එච්. ටී. කමල් පත්මසිරි මහතාගේ මඟ පෙන්වීම මත නියෝජ්‍ය සංගණන කොමසාරිස් ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්සහ සහකාර සංගණන කොමසාරිස් ලෙස සහකාර ප්‍රාදේශීය ලේකම් වරුන් කටයුතු කරන ලදී. ග්‍රාම නිලධාරීන් විශේෂ අධීක්ෂණ නිලධාරීන් ලෙස කටයුතු කලහ.

සංගණන අධිකාරී, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් සුරංජනා විද්‍යාරත්න මහත්මියගේ තාක්ෂණික උපදෙස් මත දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී ලෙස අධ්‍යාක්ෂවරයෙක්, සහකාර සංගණන අධිකාරීන් ලෙස ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ සහ සංඛ්‍යාලේඛනඥවරු, සංගණන නිලධාරීන් ලෙස සංඛ්‍යාලේඛන නිලධාරීන් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ඇතුළු ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන් විශාල සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික් සංගණන කටයුතු සඳහා සහභාගී විය.

කොළඹ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ මෙහෙයුම මත ඉහත සඳහන් සියලුම නිලධාරීන්ගේ දැඩි කැපවීම තුලින් සංගණන ක්ෂේත්‍ර කටයුතු සාර්ථකව නිම කිරීමට හැකි විය.

## 2012 ජන සංගණනයේ මූලික වාර්තා 11 (තාවකාලික) ට අනුව

01. කොළඹ දිස්ත්‍රික්කයේ මුළුජනගහනය 2,309,809 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 11.4%
02. කොළඹ දිස්තික්කයේ ජනගහනය වයස් ව්‍යුහය අනුව සලකා බැලීමේ දී වයස අවු: 15ට අඩු 22.4% ක් ද, වයස අවු: 15-59 ජනගහනය 64.3%ක් ද, අවු: 60 හා ඊට වැඩි 13.3% වශයෙන් පවතී.
03. ජන වර්ග ප්‍රතිශතය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල 76.7%, ශ්‍රී ලංකා දෙමළ 10.0%, ඉන්දියානු දෙමළ 1.2%, ශ්‍රී ලංකා යෝනක10.5% සහ වෙනත් ජාතීන් 1.6% වේ.
04. ආගම් අනුව කොළඹ දිස්ත්‍රික් ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය සැලකීමේදී බෞද්ධ 70.7%ක්, හින්දු 7.9%ක්, ඉස්ලාම්11.8%ක්, රෝමානු කතෝලික 6.8%ක්, වෙනත් ක්‍රිස්තියානි 2.8% ක් සහ වෙනත් ආගම් 0.1% ලෙස දැක්විය හැකිය.
05. 2012 සංගණනයට අනුව දිස්ත්‍රික්කයේ පුමිතිරි අනුපාතය 97.0% කි. මෙයින් ස්ත්‍රී සඛ්‍යාව 100 කට සිටින පුරුෂයින් සංඛ්‍යාව පෙන්නුම් කෙරේ. මෙය1981 දී 111.2% සහ 2001 සංගණනයේදී 104.7% ක් වශයෙන් පැවතුණි.

### 01b. කෘෂිකාර්මික සංගණනය

I. මෙම සංගණනයේ දී සියලුම කෘෂිකාර්මික බිම් ප්‍රමාණයන් ආවරණය වන පරිදි තොරතුරු එක් රැස් කිරීම සිදුවේ. (ගොවිකාරකත්වය, භෝග වර්ග අනුව ඉඩම් ප්‍රමාණය, අස්වැන්න හා වගාව පිළිබඳ වෙනත් තොරතුරු ග්‍රා.නි. මට්ටමින් ලබා ගැනීම)

II. වසර දහයකට වරක් පවත්වන මෙම කෘෂිකාර්මික සංගණනය කර්මාන්ත, වෙළඳ හා සේවා අංශ සමඟ ඒකාබද්ධව 2013/2014 වර්ෂ වල ආර්ථික කටයුතු සංගණනය ලෙස පැවැත්වීමට කටයුතු කරගෙන යන අතර දිස්ත්‍රික් මට්ටමින් අදහස් ඉදිරිපත් කිරීම් කටයුතු සහ සංවිධානය කිරීම මේ දින වල සිදු කරමින් පවතී.

### 01c. කර්මාන්ත සංගණනය

I. වසර දහයකට වරක් මෙම සංගණනයේ දී සියලුම කර්මාන්ත ආයතන පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම සිදුවේ. (කර්මාන්ත ස්වභාවය, සේවා නියුක්තිය, නිෂ්පාදනය,අමු ද්‍රව්‍ය සහ ශක්ති පරිභෝජනය ගණනය කිරීම)

II. වසර දහයකට වරක් පවත්වන මෙම කර්මාන්ත සංගණනය කෘෂිකාර්මික වෙළඳ හා සේවා අංශ සමඟ ඒකාබද්ධව ආර්ථික කටයුතු සංගණනය නමින් 2013/2014 වර්ෂ වලදී පැවැත්වීමට කටයුතු කරගෙන යන අතර දිස්ත්‍රික් මට්ටමින් අදහස් ඉදිරිපත් කිරීම් කටයුතු සහ සංවිධානය කිරීම මේ දින වල සිදු කරමින් පවතී.

### 01d. වෙළඳ හා සේවා සංගණනය

I. මෙම සංගණනයේ දී සියලුම වෙළඳ හා සේවා ආයතන පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම සිදුවේ. (වෙළඳ හා සේවා ආයතනයේ ස්වභාවය, සේවා නියුක්තිය, සේවාව, භාවිත ද්‍රව්‍ය සහ ශක්ති පරිභෝජනය ගණනය කිරීම)

II. වසර දහයකට වරක් පවත්වන මෙම වෙළඳ හා සේවා සංගණනය කෘෂිකර්ම සහ කර්මාන්ත අංශ සමඟ ඒකාබද්ධව ආර්ථික කටයුතු සංගණනය නමින් 2013/2014 වර්ෂ වලදී පැවැත්වීමට කටයුතු කරගෙන යන අතර දිස්ත්‍රික් මට්ටමින් අදහස් ඉදිරිපත් කිරීම් කටයුතු සහ සංවිධානය කිරීම මේ දින වල සිදු කරමින් පවතී.

## 02 සමීක්ෂණ කටයුතු

### 02a. වීඅස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රා.ලේ. කොට්ඨාශ 06 ක (කඩුවෙල, හංවැල්ල, මහරගම, හෝමාගම, කැස්බෑව, පාදුක්ක) මෙම සමීක්ෂණ සෑම වර්ෂයකම යල හා මහ කන්න වශයෙන් සිදු කරයි. මෙමගින් ලබා ගන්නා දත්තයන් වී නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම සඳහා යොදා ගනී.

### 02b. ශ්‍රම බල සමීක්ෂණය

කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රා.ලේ. කොට්ඨාශ සියල්ලේම නාගරික, ග්‍රාමීය යන අංශ දෙක සඳහාම මාසිකව මෙම සමීක්ෂණය සිදු කරයි. මෙමඟින් ලබා ගන්නා දත්තයන් මඟින් රැකියා වියුක්තිය, ශ්‍රම බලකාය ගණනය කිරීම සිදු කරයි. 2012 වර්ෂයේ දී සියළුම ප්‍රා.ලේ. කොට්ඨාශ නියෝජනය වන අයුරින් ගෘහ ඒකක 2200 ක පමණ නියැදියක් මේ සඳහා යොදා ගන්නා ලදී.

### 02c. ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය

දරිද්‍රතා දර්ශක සහ වෙනත් අත්‍යාවශ්‍ය සංඛ්‍යාති ඇස්තමේන්තු කිරීම සඳහා ගෘහ ඒකකවල ආදායම් වියදම් පිලිබඳව මෙම සමීක්ෂණය මඟින් තොරතුරු මාසිකව එක්රැස් කරන අතර දිස්ත්‍රික්කය පුරා අදාල නියැදි වල සමීක්ෂණ කටයුතු සිදු කිරීම.මෙම සමීක්ෂණයේ දී නිලධාරියෙක් එක් නිවාස ඒකකයකට සතියක් තුලදී තුන් වතාවක් පැමිණ තොරතුරු එක්රැස් කිරීම විශේෂ අවස්ථාවකි.

### 02d. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය

වර්ෂයකට වරක් කොළඹ දිස්ත්‍රික්කයට අයත් සියලුම ප්‍රා.ලේ. කොට්ඨාශ ආවරණය වන පරිදි කර්මාන්ත ආයතන පිළිබද තොරතුරු රැස් කිරීම සිදු කරයි. ලබා ගන්නා තොරතුරු ජාතික ගිණුම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමට හා දළ දේශීය නිෂ්පාදිතයන් (GDP)ගණනය කිරීමට යොදා ගනී. මෙම වසරේ දී කොළඹ දිස්ත්‍රික්කය තුල කර්මාන්ත ආයතන 1100 ක නියැදියක සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

**02e. ත්‍රෛයි මාසික කර්මාන්ත සමීක්ෂණය**

වර්ෂයේ කාර්තු 04 සඳහා කර්මාන්ත ආයතන වලින් ලබා ගන්නා නිෂ්පාදනයන් හා වියදම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම මෙම සමීක්ෂණයේ මූලික අරමුණයි. මෙහිදී ලබා ගන්නා තොරතුරු ජාතික ගිණුම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමට හා දළ දේශීය නිෂ්පාදිතයන් (GDP)ගණනය කිරීමට යොදා ගනී. මේ සඳහා කර්මාන්ත ආයතන 180 ක නියැදියක් තෝරා ගන්නා ලදී.

**02f. වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය**

වාර්ෂිකව කෙරෙන ඉදි කිරීම් ප්‍රමාණය, ඒ සඳහා යොදා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය, ශ්‍රම වැය කිරීම සහ වියදම් වැනි දත්තයන් ලබා ගැනීම මේ තුලින් සිදුවේ.

## 03 සාමාන්‍ය දත්ත රැස් කිරීමේ කටයුතු

**03a. වී සංඛ්‍යාලේඛන (P1/P2 වාර්තාව)**

කොළඹ දිස්ත්‍රික්කයේ වී වගා කරන ප්‍රා.ලේ. කොට්ඨාශ 07 ක (කඩුවෙල, හංවැල්ල, මහරගම, හෝමාගම, කැස්බෑව, පාදුක්ක සහ කොළොන්නාව) යල සහ මහ කන්නයන් දෙක සඳහා වාරි ක්‍රම යටතේ ග්‍රා.නි. කොට්ඨාශ මට්ටමෙන් අස්වද්දන හා කපා ගත් කුඹුරු බිම් ප්‍රමාණය රැස් කිරීම සිදු කරයි. මේ අනුව 2011/12 මහ කන්නයේ වී වගා කල බිම් ප්‍රමාණය අක්කර 10823 ක් වන අතර 2012 යල කන්නයේ දී අක්කර 2245.6 කි.

මෙම දත්තයන් වී වගා කල බිම් ප්‍රමාණය හා ජාතික වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරයි.

**03b. ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන (H2 වාර්තාව)**

කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික භෝග වගා කරන ප්‍රා.ලේ. කොට්ඨාශ 07 ක(කඩුවෙල, හංවැල්ල, මහරගම, හෝමාගම, කැස්බෑව, පාදුක්ක සහකොළොන්නාව) යල සහ මහ කන්නයන් දෙක සඳහා තෝරා ගත් භෝග වර්ග 66 ක් සඳහා ග්‍රා.නි.කොට්ඨාශ මට්ටමෙන් තොරතුරු රැස් කිරීම සිදු කරයි.

දළ දේශීය නිෂ්පාදිතයන් (GDP)ගණනය කිරීමට යොදා ගනී.

**03c.සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන (L වාර්තාව)**

කොළඹ දිස්ත්‍රික්කයේ සත්ව පාලන සිදු කරන ප්‍රා.ලේ. කොට්ඨාශ 07 ක (කඩුවෙල, හංවැල්ල, මහරගම, හෝමාගම, කැස්බෑව, පාදුක්ක සහ කොළොන්නාව) වර්ෂයකට වරක් ග්‍රා.නි.කොට්ඨාශ මට්ටමෙන් සතුන් වර්ග 06 ක ප්‍රමාණයන් කිරි හා බිත්තර නිෂ්පාදනයන් හා සත්ව ගොවිපල් පිළිබඳ තොරතුරු රැස් කරයි. 2012 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ ගවයන්, කුකුළන්, එළුවන්, ඌරන් සහ කළුකුන් පිළිබඳ තොරතුරු වාර්තා විය.

මෙම දත්තයන් ජාතික ගිණුම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමට හා දළ දේශීය නිෂ්පාදිතයන් (GDP) ගණනය කිරීමට මෙන්ම ආහාර තුලිත සටහන (national food balanced sheet) සෑදීම සඳහා යොදා ගනී.

**3c. මස් පිණිස මරන ලද සතුන්ගේ සංඛ්‍යාලේඛන**

කොළඹ දිස්ත්‍රික්කයට අයත් සියලුම ප්‍රා.ලේ. කොට්ඨාශ වලින් නීත්‍යානුකූලව ඝාතනය කරන ලද එළහරක්, එළුවන් හා ඌරන් ප්‍රමාණය පිළිබඳ තොරතුරු රැස් කරයි.

මෙය ඒක පුද්ගල ආහාර පරිභෝජන දර්ශකය (Per capita food consumption index) සෑදීමට යොදා ගනී.

**3d. ගොඩනැගිලි සංඛ්‍යාලේඛන(BS/U/I)**

පලාත් පාලන ආයතන මට්ටමින් මාසිකව ගොඩනැගිලි සංඛ්‍යාලේඛන ලබා ගැනීම ගොඩනැගිලි වර්ගය, වර්ග ප්‍රමාණය, මහල් ගණන සහ ප්‍රධාන ඉදිකිරීම් ද්‍රව්‍ය වැනි තොරතුරු එක් රැස් කිරීම සහ බලපත් අනුකූලතා සහතික වලට අනුව ලබාදීම පිළිබඳ තොරතුරු රැස් කිරීම සිදු කරයි.

මෙම දත්තයන් ජාතික ගිණුම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමට භාවිතා කරයි.

**3e. පළාත් පාලන ආයතන සංඛ්‍යාලේඛන**

කොළඹ දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතන වලින් ඉටු කරන ලද සේවාවන් , ලබා ගත් ආදායම් වියදම් පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ලබා ගැනීම මේ යටතේ සිදු කරයි.

මෙය ජාතික ගිණුම් ඇස්තමේන්තු සෑදීමට භාවිතා කරයි.

**3f. නාගරික සිල්ලර මිල**

I. කොළඹ නගරයේ පාරිභෝගික භාණ්ඩ වල සිල්ලර මිල ගණන් සතිපතා (අඟහරුවාදාදිනවල ) එක් රැස් කර ප්‍රධාන කාර්යාලයට යැවීම.

II. නුගේගොඩනගරයේසිල්ලර මිල ගණන් පහත සඳහන් පරිදි රැස්කර ප්‍රධාන කාර්යාලයට යැවීම.

I වන කාණ්ඩය : සෑම මසකම පලවන සතියේ සහ තුන් වන සතියේ එක්රැස් කෙරේ.
II වන කාණ්ඩය : මාස්පතා එක්රැස් කෙරේ.
IIIවන කාණ්ඩය : සෑම තුන් මසකට වරක් එක්රැස් කෙරේ.

මෙම තොරතුරු කොළඹ පාරිභෝගික මිල දර්ශකය සෑදීමට භාවිතා කරයි.

**3i. නිෂ්පාදකයාගේ මිල**

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 08ක (කොළඹ, තිඹිරිගස්යාය, දෙහිවල, රත්මලාන, ශ්‍රී ජයවර්ධනපුර හැර) සෑම මසකම දෙවන සතියේ දී එම ප්‍රදේශයේ තෝරා ගත් ස්ථාන 03 කින් නිෂ්පාදන මිල රැස් කරයි.

මෙය ජාතික ගිණුම් පිළියෙල කිරීමට හා උද්දමනය ගණනය කිරීම සඳහා භාවිතා කරයි.

## දිස්ත්‍රික් ජනගහන තොරතුරු

| වර්ෂය | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|
| **2012 සංඛ්‍යා ලේඛණ** | 1172672 | 1136527 | 2309199 |




## වාර්ගිකත්වය අනුව ජනගහන තොරතුරු - 2012 සංඛ්‍යා ලේඛණ අනුව

| සිංහල | ශ්‍රී ලංකා දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | මැලේ | බර්ගර් | ශ්‍රීලංකා චෙට්ටි | භාරත | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 177319 | 231318 | 27336 | 242728 | 12463 | 13304 | 1314 | 721 | 9306 | 2309199 |




## ආගම් අනුව දිස්ත්‍රික්කයේ ජනගහනය.

| බෞද්ධ | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | වෙනත් ක්‍රිස්තියානි | වෙනත් |
|---|---|---|---|---|---|
| 1631999 | 182342 | 271719 | 157120 | 63591 | 3038 |




එසේම කොළඹ දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ 15 කින් සහ පළාත්පාලන ආයතන 13 කින් සමන්විතය.

# 11. සංස්කෘතික අංශය

**අංශය මගින් කෙරෙන කාර්යයන් පහත පරිදි වේ.**

- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් දෙනු ලබන වැඩසටහන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කරනු ලබන්නේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික අංශය මගිනි.

- මීට අමතරව කොළඹ දිස්ත්‍රික්කය තුල රජයේ හා පෞද්ගලික අංශයේ සියළු ආයතන සමග සංස්කෘතික ප්‍රවර්ධණ වැඩසටහන් සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම ද සිදු කරනු ලබයි.

- සමාජ සංස්කෘතිය හා සාහිත්‍ය කලාව පිළිබඳ ආකල්ප සංවර්ධනය කිරීම ,අංකුර කලාකරුවන්ගේ නිර්මාණ කුසලතා එළි දැක්වීම ,කලාකරුවන් සම්මාන සඳහා නිර්දේශ කිරීම ,ලේඛක ආධාර ,කලායතන ආධාර නිර්දේශ කිරීම මෙන්ම සාහිත්‍ය කලාවේ රසය සමාජගත කිරීම තුළ රස වින්දන ශක්තියෙන් හෙබි හා දේශීය සංස්කෘතික අනන්‍යතාවය සුරැකීම ,එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් ගරු කරන සංවේදී ජන සමාජයක් ගොඩ නැගීම සඳහා උපකාරී වන්නා වූ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

## 2012 වර්ෂයේ සංස්කෘතික අංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්

| වැඩසටහන | වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක් | වැඩසටහන පැවැත්වූ ස්ථානය | වැඩසටහන පැවැත්වූ දිනය |
|---|---|---|---|
| නව අවුරුදු වැඩසටහන හා අවුරුදු මේසය | 2102 නව වසර උදාව සමරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සියළුම නිළධාරී මහත්ම මහත්මීන්ට ආශිර්වාද පතා සර්ව ආගමික පූජකවරුන්ගේ සහභාගීත්වයෙන් සර්ව ආගමික වැඩසටහනක් පවත්වන ලද අතර දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයේ දේශීය සංස්කෘතික අනන්‍යතාවය සනිටුහන් කරමින් කිරිබත් හා රසකැවිලි වලින් සපිරි තේ පැන් සංග්‍රහයක් ද කාර්යාල නිළධාරීන්ගේ අනුග්‍රහයෙන් සිදු කරන ලදි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2012 ජනවාරි මස 02 වන සඳුදා දින |
| කොළඹ දිස්ත්‍රික් 64 වන නිදහස් උත්සව සැමරුම | 64 වන ජාතික නිදහස් දිනය සමරමින් සමරු උත්සවයක් ඉතා උත්කර්ෂවත් අයුරින් කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමාගේ උපදේශකත්වයෙන් පවත්වන ලදි.<br>මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන බාලක බාලිකා පාසල් 27 ක පමණ තූර්යවාදක කණ්ඩායම් හා ආචාර පෙළපාලි ද සහභාගී විය. ජාතික ශිෂය භට බලකාය 3 වන බල ඇණිය සම්මාන මුරයක් ද පවත්වන ලදි. මෙහි ප්‍රධාන | කොළඹ මහ නගර සභා පිටිය | 2012 පෙබරවාරි මස 04 වන සෙනසුරාදා දින |

| | | | |
|---|---|---|---|
| | ආරාධිත අමුත්තා ලෙස බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාර අලවි මව්ලානා මැතිතුමා ද කොළඹ නගරාධිපති ඒ. ජේ. එම්. මුසම්මිල් මැතිතුමා ද කොළඹ දිස්ත්‍රික් ලේකම් එච්. ටී. කමල් පද්මසිරි මහතා විසින් සම්මාන මුරය පිළිගනු ලැබීය. | | |
| සැපතකි මේ දරු වැඩසටහන - | උසස් සංස්කෘතික ජීවිතයක් හෙබි පුරවැසියන් බිහිකිරීමේ අරමුණින් පාසල් හා දහම් පාසල් දරු දැරියන් මානසික හා අධ්‍යාත්මික ගුණවගාවන්ගෙන් පෝෂණය කිරීම උදෙසා කොළඹ දිස්ත්‍රික්කයේ දරු දැරියන් සඳහා සැපතකි මේ දරු උපදේශාත්මක නිර්මාණ එකතුව ග්‍රන්ථය ලබා දෙමින් ආකල්ප-සාරධර්ම වැඩි දියුණු කිරීමේ දේශණ 2012 වසර පුරාම පවත්වන ලදි. | ප්‍රා.ලේ. කොට්ඨාශ 13 හි දහම්පාසල් තුළ | 2012 ජනවාරි මස 01 සිට දෙසැ. 31 දක්වා වසර පුරා |
| වෙසක් භක්ති ගීත වැඩසටහන | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි ම නිලධාරී මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් භක්ති ගීත කණ්ඩායම් 13 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය භක්ති ගීත කණ්ඩායම මීට සහභාගී විය. බාහිර විනිශ්වය මණ්ඩලයක් මගින් ජයග්‍රාහකයින් තෝරා ත්‍යාග හා සහතිකපත් පිරිනමන ලදි. මෙහි ප්‍රථම, දෙවන,තෙවන ස්ථාන පිළිවෙලින් රත්මලාන, කොළොන්නාව, කොළඹ ප්‍රා. ලේ. කාර්යාල විසින් දිනා ගන්නා ලදි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2012 මැයි මස 06 වන ඉරු දින |
| සංස්කෘතික දිනය සැමරුම් උත්සවය - | ලෝක සංස්කෘතික දිනය සැමරීමේ උත්සවය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ඉතා උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදි. ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ජන කොටස් හා උප සංස්කෘතින් නියෝජනය කරමින් සංස්කෘතික විචිත්‍රාංග ඉදිරිපත් කරනු ලැබීය. | මරදාන ටවර් රඟහල | 2012 මැයි මස 22 වන අඟහරුවාදා දින |
| පොසොන් පොහොය වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා මහාචාර්ය සුමනදාස ගල්මංගොඩ මහතාගේ දේශණයක් ප්‍රශ්න සාකච්ඡා ස්වරූපයෙන් පවත්වනු ලැබීය. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2012 ජූනි මස 05 වන අඟහරුවාදා දින |
| රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල | කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින චිත්‍ර හා මූර්ති ශිල්පීන්ගෙන් නිර්මාණ කැඳවා ජාතික මට්ටමට සුදුසු නිර්මාණ තොරා ගන්නා ලද්දේ ප්‍රදර්ශනය තුළදීමය. | ජාතික කලා භවන | 2012 ජූනි මස 28 වන බ්‍රහස්පතින්දා දින |
| දයානන්ද ගුණවර්ධන සැමරුම | ප්‍රවීණ නාට්‍ය ශිල්පි දයානන්ද ගුණවර්ධනයන්ගේ ගුණ සැමරුම් උත්සවයක් සුදර්ශි ආයතනයේ මූලිකත්වයෙන් පවත්වන ලදි. | සුදර්ශි ආයතනය - කොළඹ | 2012 ජූනි මස 30 වන සෙනසුරාදා දින |
| කලායතන නර්තන වැඩමුළුව | කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින නර්තන කලායතනාධිපතිවරුන් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා දේශණ සහිත වැඩමුළුවක් පවත්වන ලදි. | ජෝන් ද සිල්වා සමරු රඟහල | 2012 ජූලි මස 08 වන ඉරු දින |
| කොළඹ දිස්ත්‍රික් රාජ්‍ය ළමා චිත්‍ර උළෙල | කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින අවු 5- 18 ත් අතර සිසු සිසුවියන්ගෙන් නිර්මාණ කැඳවා අවසන් වටය සඳහා නිර්මාණ තෝරා ගන්නා ලදි. | කඩුවෙල ශ්‍රී සීලාලංකාර විද්‍යාලය | 2012 අගෝස්තු 18 වන සෙනසුරාදා දින |
| අන්තර් කලායතන නර්තන තරග | කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම කලායතන වලින් අයදුම්පත් කැඳවා නියමිත චක්‍රෙල්ඛයට අනුව තරග පවත්වා ජයග්‍රාහකයින් සඳහා සම්මාන ලබා දෙන ලදි. | සුදර්ශි ආයතනය - කොළඹ | 2012 ජූලි මස 28 වන සෙනසුරාදා දින |
| ගාමිණී | ප්‍රවීණ වීදි නාට්‍ය ශිල්පි ගාමිණී හත්තෙටුවේගම ගේ ගුණ | සුදර්ශි ආයතනය | 2012 ජූලි 26 |

| | | | |
|---|---|---|---|
| හත්තෙටුවේගම ප්‍රණාම උළෙල | සැමරුම් උත්සවයක් සුදර්ශි ආයතනයේ මූලිකත්වයෙන් පවත්වන ලදි. | - කොළඹ | බ්‍රහස්පතින්දා දින |
| සර්වඥ ධාතු ප්‍රදර්ශනය | කපිලවස්තු සිට වඩමවන ලද සර්වඥ ධාතු ප්‍රදර්ශනය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම හා ප්‍රදර්ශනය දිස්ත්‍රික් ලේකම්තුමාගේ උපදේශකත්වයෙන් සංවිධානය කිරීම. | හුණුපිටිය ගංගාරාමය | 2012 සැප්තැම්බර් මස 06/07/08/09/10 දිනයන්හි |
| දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය | කොළඹ දිස්ත්‍රික් ජනතාවගේ සාහිත්‍ය රසාස්වාදය පෝෂණය කිරීම සඳහා මෙන්ම අංකුර නිර්මාණකරුවන් දිරිමත් කිරීමේ අරමුණින් සංවිධානය කළ සාහිත්‍ය උත්සවය ප්‍රවීන කලාකරුවන් රැසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. ප්‍රාදේශීය සාහිත්‍ය නිර්මාණ තරග වලින් ජයග්‍රහණය කරන ලද තරගකරුවන් අතරින් දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලදි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2012 සැප්තැම්බර් මස 24 වන සඳුදා දින |
| දිස්ත්‍රික් රාජ්‍ය නර්තන උළෙල | කොළඹ දිස්ත්‍රික්කය තුල ඇති සියළුම කලායතන හා පාසල්/වෙනත් ආයතන වලින් අයදුම්පත් කැඳවා නියමිත චක්‍රෙල්ඛයට අනුව තරග පවත්වා ජයග්‍රාහකයින් ජාතික මට්ටමට නිර්දේශ කරන ලදි. | ජෝන් ද සිල්වා සමරු රගහල | 2012 ඔක්තොම්බර් 26 සිකුරාදා දින |
| දහම් පාසල් සිසු නිපුනතා වැඩසටහන | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද දහම් පාසල් සිසුන්ගේ නිපුණතා වැඩසටහන සඳහා විනිශ්චය කටයුතු කරන ලදි. | සෙන් ජෝන් විදුහල - නුගේගොඩ | 2012 ඔක්තොම්බර් 28 ඉරිදා දින |
| ජාතික ළමා නාට්‍ය උළෙල | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් කැඳවා පවත්වනු ලැබූ තරග වට සඳහා සහභාගී විය. | ජෝන් ද සිල්වා සමරු රගහල | 2012 ජුලි - අගෝස්තු මාස තුළ |
| ජාතික කෙටි/දිගු නාට්‍ය උළෙල | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් කැඳවා පවත්වනු ලැබූ තරග වට සඳහා සහභාගී විය. | ජෝන් ද සිල්වා සමරු රගහල | 2012 ජුලි - අගෝස්තු මාස තුළ |
| ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව සඳහා සම්බන්ධ වීම | කොළඹ දිස්ත්‍රික් ජනතාවගේ සාහිත්‍ය රසාස්වාදය පෝෂණය කිරීම සඳහා මෙන්ම අංකුර නිර්මාණකරුවන් දිරිමත් කිරීමේ අරමුණින් සංවිධානය කළ සාහිත්‍ය උත්සවය ප්‍රවීන කලාකරුවන් රැසකගේ සහභගීත්වයෙන් පවත්වන ලදි. | ප්‍රා.ලේ. කොට්ඨාශ 13 හි | 2012 සැප්තැම්බර් මස 01 සිට 31 දක්වා |
| කලායතන සමීක්ෂණ කටයුතු | කොළඹ දිස්ත්‍රික්කය තුල ඇති කලායතන සම්බන්ධයෙන් ඇති ගැටළු හා කාලයන් සම්බන්ධයෙන් විමසීමටත්, කලායතන ආධාර නිර්දේශ ලබා දීමටත් සමීක්ෂණයට කරන ලදි. | ප්‍රා.ලේ. කොට්ඨාශ 13 හි | 2012 ජනවාරි මස 01 සිට දෙසැම්බර් 31 දක්වා |

# 12. සමාජසේවා අංශය

කොළඹ දිස්ත්‍රික්කයේ සමාජ සේවා හා සමාජ සුභසාධන අංශයෙන් දිස්ත්‍රික්කයේ වෙසෙන පහත සඳහන් ජන කණ්ඩායම් සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

1. ආබාධ සහිත පුද්ගලයින් සහ එම පවුල් වල ජීවන තත්වය උසස් කිරිම
   (අපස්මාර රෝගය නිසා මානසික ආබාධ ඇති හා මානසික චලන ආබාධ, කථා කිරීමේ , පෙනීමේ, ඇසීමේ ආබාධ)
2. තනිමාපිය පවුල් සංවර්ධන වැඩ සටහන
3. වයස අවු:60 ඉක්ම වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ වැඩසටහන
4. මත්නිවාරන හා පුනරුත්ථාපන වැඩසටහන
5. වෙනත් සමාජ ප්‍රශ්ණ වලින් පිඩාවිදින පවුල් හා පුද්ගලයින්

## මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශන පරිදි

| අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | මාසයට වැයවෙන මුදල | වාර්ෂික වැය |
|---|---|---|---|---|
| 01 | දෙහිවල | 34 | රු102000.00 | රු1224000.00 |
| 02 | කොළඹ | 34 | රු102000.00 | රු1224000.00 |
| 03 | සීතාවක | 34 | රු102000.00 | රු1224000.00 |
| 04 | හොමාගම | 34 | රු102000.00 | රු1224000.00 |
| 05 | මහරගම | 34 | රු102000.00 | රු1224000.00 |
| 06 | කඩුවෙල | 34 | රු102000.00 | රු1224000.00 |
| 07 | කැස්බෑව | 34 | රු102000.00 | රු1224000.00 |
| 08 | කොලොන්නාව | 34 | රු102000.00 | රු1224000.00 |
| 09 | පාදුක්ක | 34 | රු102000.00 | රු1224000.00 |
| 10 | රත්මලාන | 34 | රු102000.00 | රු1224000.00 |
| 11 | මොරටුව | 34 | රු102000.00 | රු1224000.00 |
| 12 | තිඹිරිගස්යාය | 34 | රු102000.00 | රු1224000.00 |
| 13 | ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ | 34 | රු102000.00 | රු1224000.00 |
| | එකතුව | | | රු 15912000.00 |

2. ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන සී.බී.ආර්.

ආබාධ සහිත පුද්ගලයින්ගේ හා එම පවුල්වල ජීවන තත්ත්වය සංවර්ධනය කිරීම හා ඔවුන් ප්‍රධාන සංවර්ධන ධාරාවට දායකකර ගැනීම සඳහා මෙම වැඩසටහන සමාජ සේවා අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය යටතේ

ක්‍රියාත්මක වේ.මෙම වැඩසටහන පුහුණු ස්වේච්ඡා සේවක මහත්ම මහත්මීන්ගේ දායකත්වය මත නිවෙස් මට්ටමින් ක්‍රියාත්මක වේ.නිවෙස් මට්ටමේ පුනරුත්ථාපනය සඳහා මූලික අවධානය යොමුකරන මෙම වැඩ සටහන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමේ මෙහෙයුම් කමිටුව හා කොළඹ දිස්ත්‍රික් සීබිආර් මූලික කණ්ඩායම මගින් අධීක්ෂණය කෙරේ. ඒ අනුව 2012 වර්ෂය සඳහා වෙන්කර දී තිබෙන මූල්‍ය ප්‍රතිපාදන පහත දැක්වේ.

| අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | ලබාදෙන ලද ප්‍රතිපාදන |
|---|---|---|
| 01 | දෙහිවල | රු10.000.00 |
| 02 | කොළඹ | රු10.000.00 |
| 03 | සීතාවක | රු10.000.00 |
| 04 | හොමාගම | රු10.000.00 |
| 05 | මහරගම | රු10.000.00 |
| 06 | කඩුවෙල | රු10.000.00 |
| 07 | කැස්බෑව | රු10.000.00 |
| 08 | කොලොන්නාව | රු10.000.00 |
| 09 | පාදුක්ක | රු10.000.00 |
| 10 | රත්මලාන | රු10.000.00 |
| 11 | මොරටුව | රු10.000.00 |
| 12 | තිඹිරිගස්යාය | රු10.000.00 |
| 13 | ශ්‍රී ජයවර්ධනපුර කොට්ටෙ | රු10.000.00 |
| | එකතුව | රු150000.00 |

මෙම වැඩ සටහන දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරනය කිරිම සඳහා සි.බී.ආර්. මූලික කණ්ඩායම් රැස්වීම් 05 ක් වසර පුරා පැවැත්විමට හැකිවිය.

එයට අමතරව සෘජු අධාර ලෙස විශේෂ වැසිකිළි හා නිවාස රාශියක් ඉදිකරිමට හා ස්වයං රැකියා ආධාරද ලබා දෙන ලදි.හදිසි ගින්න නිසා මෙම විස්තර ලබා දිමට නොහැකි විම ගැටළුවකි.

## 13. තරුණසේවා අංශය

කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ සේවා අංශයේ 2012 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පහත පරිදි වේ.

| **වැඩසටහන් විස්තරය** | **ප්‍රතිපාදන** | **වැයදැරීම්** |
|---|---|---|
| යෞවන සමාජ පිහිටුවීම | 7000.00 | 7000.00 |
| පාසැල් නායකත්ව පහුණු කඳවුර | 97750.00 | 97750.00 |
| ප්‍රාදේශිය නායකත්ව පුහුණු කඳවුර | 79000.00 | 79000.00 |
| | | |
| **ප්‍රාදේශිය ක්‍රිඩා** | | |
| දෙහිවල | 22750.00 | 22750.00 |
| රත්මලාන | 22750.00 | 22750.00 |
| කෝට්ටේ | 22750.00 | 22750.00 |
| බොරැල්ල | 22750.00 | 22750.00 |
| නැගෙනහිර කොළඹ | 22750.00 | 22750.00 |
| මැද කොළඹ | 22750.00 | 22750.00 |
| | | |
| දිස්ත්‍රික් ක්‍රීඩා | 30500.00 | 30500.00 |
| විදේශ වැඩසටහන් | 9500.00 | 9500.00 |
| යොවුන් නාට්‍ය සංදර්ශනය | 86000.00 | 86000.00 |
| ජාතික තරුණ දිනය | 170000.00 | 170000.00 |
| මාධ්‍ය ප්‍රචාරය | 94000.00 | 94000.00 |
| යොවුන් නවෝදය | 7000.00 | 7000.00 |
| යොවුන් සිතය දහම් සුවය | 72500.00 | 72500.00 |
| යොවුන් නාට්‍ය උළෙල | 82500.00 | 82500.00 |
| | | |
| **යෞවන සම්මාන** | | |
| යෞවන සම්මාන තරඟ | 81500.00 | 81500.00 |
| යෞවන සම්මාන උළෙල | 70000.00 | 70000.00 |
| දේශිය තරුණ හුවමාරු වැඩසටහන (ස්වේච්ඡා) | - | - |
| | 1669250.00 | 1669250.00 |

දිස්ත්‍රික්කය - නාගරික තරුණයා දිස්ත්‍රික් කාර්යාලය

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන පැවැත් වූ ස්ථානය | වැඩසටහන පැවැත් වූ දිනය | මුළු තරුණ සහභාගිත්වය | | | | ආයතන |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මලල ක්‍රීඩා | ක/තරග | කාන්තා | පිරිමි | |
| 1 | ජාතික තරුණ දිනය | රත්මලාන වෘත්තීය පුහුණු ආයතනය | 2012/05/23. | | | 110 | 83 | |
| 2 | දිස්ත්‍රික් ක්‍රීඩා තරග. | | 2012/07/01. | 1350 | 560 | | | |
| 3 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. බොරලැල්ල. | සුගතදාස ස්ටේඩියම් | 2012/06/15-16 | 250 | 200 | | | |
| 4 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. බ/කොළඹ | කුරේ ක්‍රීඩාංගනය. වැල්ලවත්ත. | 2012/06/03 | 168 | 256 | | | |
| 5 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. නැ/ කොළඹ | කුරේ ක්‍රීඩාංගනය. වැල්ලවත්ත. | 2012/06/03 | තරුණ තරුණියන් 400 ක් පමණ | | | | |
| 6 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. රත්මලාන | බිහිරි විදුහල් ක්‍රීඩාංගනය. | 2012/04/07 | | 660 | | | |
| 7 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. දෙහිවල | සරණංකර ක්‍රීඩාංගනය. දෙහිවල | 2012/04/06 | 600 | 250 | | | |
| 8 | ප්‍රාදේශීය ක්‍රීඩා තරග. මැ/කොළඹ | ගුණසිංහපුර ක්‍රීඩාංගනය. | 2012/06/16 | 200 | 300 | | | |
| 9 | දිස්ත්‍රික් යෞවන සම්මාන උළෙල | නව නගරශාලාව | 2012/09/24 | තරුණ තරුණියන් 600 ක් පමණ | | | | |
| 10 | රැකියා හිමිවරුන්ගේ හමුව | අත්තිඩිය ග්ලේන් උත්සව ශාලාව | 2012/10/05 | | | | | 103 |
| 11 | රැකියා වෙළඳ පොල | රත්මලාන කාර්මික විද්‍යාලය | 2012/10/19 | මුළු තරුණ සහභාගිත්වය (3200)<br>රැකියාගත කිරීම (285)<br>දෙවන වටය සඳහා (587) | | | | 43 |
| 12 | පාසල් නායකත්ව පුහුණු කඳවුර | එස්.එස්.ජයසිංහ විදුහල | 2012/11/2.3.4. | තරුණ තරුණියන් 50 ක් පමණ | | | | |
| 13 | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | ප්‍රස්පටෙරියන්ස් බාලිකා විදුහල | 2012/11/22 | | | 300 | | |

# 14. ආපදා කළමනාකරණ ඒකකය

## කාර්යභාරය

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ආවරණ වන පරිදි හදිසි ආපදා අවස්ථා වලදී ක්‍රියාත්මක වීම සඳහා පැය 24 ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් ඒකකයක් ඇත.එමෙන්ම දිස්ත්‍රික්කයේ ඕනෑම ආපදා අවස්ථාවකදී ආයතන සම්බන්ධීකරණ කරමින් එම ආපදා අවම කර ගැනීමට කටයුතු කරන අතර ආපදා වලින් පසු සහන කටයුතු සිදු කරයි.

## ආපදා අවම කිරීම්

එමෙන්ම ආපදා අවම කිරීම සඳහා ව්‍යාපෘති සිදු කිරීම

උදාහරණ ලෙස :- ගං වතුර අවම කිරීම් සඳහා ඇළ මාර්ග ශුද්ධ කිරීම

(හීන් ඇළ -කොළඹ ,මල්පුර ඇළ මාර්ගය -කොලොන්නාව, සපන්ටයින් -තිඹිරිගස්යාය)

නාය යෑම් අවම කිරීම සඳහා (මෙල්ෆට් ව්‍යාපෘතිය)

## ආපදා වැළැක්වීම

ආපදා වැළැක්වීමෙන් ජනතාව බේරා ගැනීමේ සුවිශේෂිය කාර්ය භාරයක් කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා උදාහරණ ලෙස

2012 වර්ෂයේ අප්‍රේල් මස 11 වන දින ඇති වූ සුනාමි අනතුරු ඇඟවීමේ දී ඉතා යුහුසුළුව ක්‍රියාකාරිත්මක වී මුහුදු බඩ ප්‍රදේශව ජනතාව ඉවත් කිරීම

## ආපදා පෙර සූදානම්

ආපදා පෙර සූදානම් කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය විසින් දිස්ත්‍රික් ආපදා පෙරසූදානම් සැලසුම් සැකසීම , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ආපදා පෙර සූදානම් සැලසුම් සැකසීමේ කටයුතු සිදු කරනු ලබන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදා වලට ගොදුරු වන ග්‍රාම නිලධාරි වසම් වල ග්‍රාමීය කමිටු පිහිටුවීම හා පිහිට වූ ග්‍රාමීය කමිටු යාවත්කාලීන කර එම කමිටු සඳහා ආපදා භාණ්ඩ කට්ටල පිරි නැමීම සිදු කර ඇත.

එමෙන්ම වෙරළබඩ කලාපයේ සුනාමි අවදානම් කලාප වල ජනතාවට නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් හා පෙරහුරු වැඩසටහන් පැවැත්වීම සිදු කරන අතර සුනාමි කලාපයේ ජනතාවගේ ආරක්ෂා සඳහා ආරක්ෂිත ගමන් මාර්ග සලකුණු කර නව ආරක්ෂිත ස්ථාන හඳුනා ඒවා සිතියම් ගත කිරීම,එමෙන්ම ජනතාව සුනාමියෙන් ආරක්ෂා කිරීම සඳහා සයිරන් නලා ස්ථාපිත කිරීම, සුනාමි කුළුණු ඇති කිරීම සිදු කර ඇත්තේ ආපදා පූර්ව දැනුම් දීමේ ක්‍රමවේද යටතේ වීම සුවිශේෂි වේ.

දිස්ත්‍රික් ආපදා සිදුවිය හැකි හේතු සහ අවස්ථා හඳුනා ගනිමින් එම හේතු සහ අවස්ථා ඉවත් කරමින් යම් හෙයකින් සිදුවිය හැකි ආපදා අවස්ථාවකදී ක්ෂණිකව මහජනතාව වෙත සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වීම මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි

| අනු අංකය | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් ප්‍රමාණය | වැය කළ මුදල | අරමුදල් සැපයූ ආයතනය | දිනය |
|---|---|---|---|---|---|
| 01 | ගිනි නිවීමේ පෙරහුරු වැඩසටහන් හා ගිනි නිවීමේ උපකරණ බෙදා දීමේ වැඩසටහන<br>1. කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිලධාරින්<br>2. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින්ට<br>3. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිලධාරින්ට | 03 | | | 2012.04.23<br>2012.04.25<br>2012.06.15 |
